වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
Annual Report

2015

සීමාසහිත ලංකා සීනි සමාගම
லங்கா சீனி நிறுவனம் லிமிட்டெட்
Lanka Sugar Company (Private) Limited.



සීමාසහිත ලංකා සීනි සමාගම

වාර්ෂික වාර්තාව 2015

27, මෙල්බෝර්න් ඇවනිව්, කොළඹ 4, ශ්‍රී ලංකාව
දුරකථන: +94 11 523 2583 ෆැක්ස්: +94 11 250 0674
ඊ මේල් : infosugarsrilanka@gmail.com

(මුල් පිටපතේ සිංහල අනුවාදයකි)

මිහිරි සඵලත්වය

කරා ගමනාරම්භයක්



පටුන

අපගේ චින්තනය, අපගේ ඉදිරි දැක්ම, අපගේ ඉලක්ක සහ උපායමාර්ග පර්යේෂණ සහ සංවර්ධනය, සංස්ථාපනික ප්‍රජා වගකීම්	04
මූල්‍යමය හා මෙහෙයුම් ක්‍රියාදාමයන් තුළ ඉස්මතුකිරීම්	06
සභාපතිතුමාගේ ප්‍රකාශය	08 - 09
අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශය	10
අවදානම් කළමනාකරණය	11
අප සංස්කෘතිය හා සාරධර්ම	12
විගණන කමිටුවේ වාර්තාව	14
අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ තොරතුරු	16 - 18
ජ්‍යෙෂ්ඨ කළමනාකරණය හා සංවිධාන ව්‍යුහය	19 - 23
විගණකාධිපති වාර්තාව	24 - 37
ලාභාලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශය	38
මූල්‍ය තත්ව ප්‍රකාශය	39
හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය	40
මුදල් ප්‍රවාහ ප්‍රකාශය	41
මූල්‍ය ප්‍රකාශනවල සටහන්	42 - 67
ඛණ්ඩ මූල්‍ය තොරතුරු පැල්වත්ත හා සෙවනගල	68 - 75
ප්‍රස්ථාරික ඛණ්ඩ තොරතුරු සැසඳීම	76
ප්‍රගති වාර්තාව - 2015	77 - 80
සංස්ථාපනික තොරතුරු	81

අපගේ චින්තනය

ග්‍රාමීය ආර්ථිකය වැඩිදියුණු කිරීමෙන් ජාතික සංවර්ධනයට දායක වීම තුලින් සීනි මත පදනම්වූ ගොවිතැන් සහ කර්මාන්ත හරහා කෘෂිකාර්මිකයන්ගේ ප්‍රජා ආර්ථික තත්වය උසස් කිරීම

අපගේ ඉදිරි දැක්ම

2025 වන විට සීනි සැපයුමින් ස්වයංපෝෂිත වීම

අපගේ ඉලක්ක

මෙහෙවර 333 - කෙටිකාලීන (2018 තෙක් වසර 3 කට)

- මෙට්‍රික් ටොන් 80,000 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
- ගොවි පවුල් 15,000 කට උපකාර කිරීම.
- සෘජු රැකියා 8,000 ක් සැපයීම.
- ගොවි පවුලක ශුද්ධ ආදායම මසකට රු.35,000 ක් දක්වා වැඩිකිරීම.
- ජාතික සීනි අවශ්‍යතාවට 15% ක් දායක වීම.
- රුබිලියන 2.2 ක ශුද්ධ ලාභයක් සාක්ෂාත් කරගැනීම.
- රුබිලියන 10 ක විදේශ විනිමයක් ඉතිරි කරගැනීම.
- සමගාමීව මෙගාවොට් 30 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

මෙහෙවර 777 - දිගුකාලීන (2022 තෙක් වසර 7 කට)

- මෙට්‍රික් ටොන් 100,000 ක සීනි නිෂ්පාදනයක් සාක්ෂාත් කරගැනීම.
- ගොවි පවුල් 20,000 කට උපකාර කිරීම.
- සෘජු රැකියා 10,000 ක් සැපයීම.
- ගොවි පවුලක ශුද්ධ ආදායම මසකට රු.40,000 ක් දක්වා වැඩිකිරීම.
- දේශීය සීනි අවශ්‍යතාවෙන් 20% ක් නිෂ්පාදනය කිරීම.
- රුබිලියන 3.5 ක ශුද්ධ ලාභයක් සාක්ෂාත් කරගැනීම.
- රුබිලියන 20 ක විදේශ විනිමයක් ඉතිරි කරගැනීම.
- සමගාමීව මෙගාවොට් 50 ක විදුලි බලයක් උත්පාදනය කිරීම.

උපාය මාර්ග

1) වගාකරුවා මත පදනම්වූ අප වගා ආකෘතිය.
2) වැඩි ඵලදාවක් ලබාදෙන ප්‍රභේදයන්, වඩාත් ගුණාත්මක කෘෂිකාර්මික ව්‍යවහාරය සහ කාර්යක්ෂම උපකාර සේවාවන් හරහා ඵලදායිතාවය වැඩිකිරීම. එමඟින් ගොවියන්ට වැඩි ප්‍රතිලාභ ලබා දීම.
3) ප්‍රමාණාත්මක සහ ගුණාත්මක ඵලදායිතාවය සඳහා දිරිගැන්වීම් ලබා දීමෙන් ගොවියන් අභිප්‍රේරණය කිරීම
4) ඵලදායිතා දිරිගැන්වීම් සහ පටිපාට හරහා නිලධාරී මණ්ඩලය අභිප්‍රේරණය කිරීම.

පර්යේෂණ සහ සංවර්ධනය

උක් පර්යේෂණ ආයතනය සමඟ උක් වගාව සහ සීනි නිෂ්පාදනය වැඩි කිරීම සඳහා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදුකරමින් පවතී.

සංස්ථාපනික ප්‍රජා වගකීම්

උක් වගාවේ යෙදෙන ගොවියන්ගේ ආදායම් අගයන් වැඩිකර, අපේ මෙහෙයුම් දියත් කරන පරිසරය සහ ප්‍රජාව තුලට අගයන් එකතු කල යුතු බව අපේ විශ්වාසයයි.



මිහිරි සඵලත්වය

සඳහා සාරවත් බවින් පොහොසත් වීම



මූල්‍යමය සහ මෙහෙයුම් ක්‍රියාදාමයන් තුල ඉස්මතුකිරීම්

(අගයන් රුපියල් මිලියන වලින් දැක්වේ)	2015	2014	2013
මූල්‍යමය ඉස්මතු කිරීම්			
පිරිවැටුම් අගය	4,881.64	5,539.31	5,747.05
විකුණුම් පිරිවැය	(5,065.36)	(4,904.06)	(3,833.75)
දළ ලාභය	(183.72)	635.25	1,913.30
බදු ගෙවීමට පෙර ශුද්ධ ලාභය	(1,052.40)	(211.01)	1,345.72

මෙහෙයුම් කාර්යසාධනය	2015	2014	2013
ඉඩම් වගාව			
ඉඩම්වගාවට සුදුසු (හෙක්ටෙයාර්)	17,499	17,499	17,499
වගාකල (හෙක්ටෙයාර්)	12,226	11,280	10,314
වගා බිම් %	70%	64%	71%

අස්වනු ව්‍යාපෘතිය	2015	2014	2013
ලබාගත් අස්වැන්න (මෙට්‍රික් ටොන්)	557,747	409,582	510,104
2015 වැඩිවීම් ප්‍රතිශතය	36%	-20%	35%
සීනි ලබාගැනීමේ ප්‍රතිශතය	7.53%	7.90%	8.34%

සීනි නිෂ්පාදනය	2015	2014	2013
මෙට්‍රික් ටොන්	42,984	32,364	42,549
එක පුද්ගල නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)	8.19	6.17	7.57

මානව සම්පත්	2015	2014	2013
ස්ථිර	1,488	1,557	1,630
ගිවිසුම් ගත	510	492	736
අනියම්	3,129	2,645	2,530
වාරික	-	510	685
පුහුණුලාභීන්	-	40	41
එකතුව	5,127	5,244	5,622

මිහිරි සවලත්වය

අහස සමග ගැටෙන විටක





සභාපතිතුමාගේ ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ 2015 වාර්ෂික වාර්තාව, අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් මම සතුටින් ඉදිරිපත් කරමි. සමාලෝචිත වර්ෂයේදී කාර්යසාධනයට බලපෑ සාර්ව හා ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාත්මක සාධක රාශියක අභියෝගවලට මුහුණදීමට සිදුවිය. සමාලෝචිත වර්ෂයේ පළමු කාර්තු තුනේ පැවති දැඩි නියං තත්වය උක්වගා ඵලදාවට හා සීනි ලබාගැනීමේ අනුපාතයට අවාසි ලෙස බලපෑවේය. ඒ නිසා, උක්වගා ඵලදාව හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් 53.82 සිට මෙට්‍රික් ටොන් 60 දක්වා වැඩි වූ අතර නිෂ්පාදන පරිමාවට ද්විත්ව බලපෑමක් කරමින් සීනි ආපසු ලබාගැනීමේ අනුපාතය 7.90% සිට 7.53% දක්වා අඩුවිය. ඉඩම් කොටසක් වාරි ජලය යොදාගෙන වගාකරන හෙයින් අපගේ සෙවනගල අංශයට එම බලපෑම අවම කරගත හැකිවිය.

ආර්ථික පරිසරය

ගෝලීය ආර්ථිකයේ අවාසි සහගත තත්වයන් යටතේ වුවත් 2014 වර්ෂයේ 4.9% ක වර්ධනයක් අත්පත් කර ගෙන තිබූ දළ ජාතික නිෂ්පාදිතය (GDP) සමාලෝචිත වර්ෂයේදී 4.8 % ක වර්ධන වේගයක් පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව සමත් විය. එබැවින්, ශ්‍රී ලංකා මහ බැංකුවට තවදුරටත් පොලී අනුපාතය පහළ දැමීමට හැකියාව ලැබුණු අතර උද්ධමනය පහළ මට්ටමක පවත්වාගෙන ගොස් තිබුණි. ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක වූයේ කෘෂිකර්මාන්තය, කාර්මික හා සේවා අංශයි.

දළ කර්මාන්ත විශ්ලේෂණය

ස්වභාවධර්මය කර්මාන්තය කෙරෙහි අයහපත් ලෙස බලපෑම් කළත්, සමාලෝචිත වර්ෂය තුළදී මෙට්‍රික් ටොන් 41,989 ක සීනි නිෂ්පාදනයක් කිරීමට අපට හැකිවිය. එය දේශීය සීනි අවශ්‍යතාවෙන් 7% ක් වූ අතර දේශීය සීනි නිෂ්පාදනයෙන් 72% ක් නියෝජනය විය. වර්ෂයේදී සීනි මිල ගණන් ගෝලීයව උග්‍ර ලෙස පහත ගිය අතර සීනි ආනයනය විශාල වශයෙන් වැඩිවිය. ආනයනකරුවන් ඔවුන්ගේ ස්වාරක්ෂක තොග පවත්වාගෙන ගොස් තිබුණි.මෙය වෙළඳපොලේ සීනි මිල පහළ යාමට හේතු වූ අතර අප ඉදිරිපත් කළ මිල ගණන්වලට තොග වෙළෙන්දන් සීනි මිලදී ගැනීමට මැලිකමක් දක්වන ලදී. රජය විසින් සීනි සඳහා බද්දක් පැනවුවද, එහි බලපෑම සම්පූර්ණයෙන් ආපසු හැරවීමට නොහැකි විය. වර්ෂයේ අවසාන භාගයේදී සීනිවල තොග මිල කිලෝ එකකට රු.90 ට වඩා අඩුවිය.

සමාගමේ කාර්යසාධනය

සමාලෝචිත මුදල් වර්ෂය තුළදී සමාගම රුමිලියන 1,052 ක බද්දට පෙර මෙහෙයුම් අලාභයක් වාර්තා කරන ලදී. එය පසුගිය වර්ෂයට සාපේක්ෂව •00% ක පහත වැටීමකි. අහිතකර කාලගුණ තත්වය සෘජුවම නිෂ්පාදන පරිමාව අඩුවීමට හා ඒ හේතුවෙන් ලාභදායීත්වය පහළ වැටීමට හේතු විය.

සුභසාධනය

සමාගම වර්ෂය තුළදී සැලකිය යුතු මුදලක් සුභසාධනය වෙනුවෙන් වැයකරන ලදී. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා යටිතල පහසුකම් නඩත්තු කිරීම සඳහා වෙනම නඩත්තු කාර්ය මණ්ඩලයක් වෙන්කරන ලදී. පෙර පාසල් හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සමාගම විසින් පවත්වාගෙන යන ලදී.

සම්භාවනාව . . . . . .

ග්‍රාමීය වගාකරන ප්‍රජාව වැඩිදියුණු කිරීම හා ඉහළනලයට ගෙන ඒම සහ ජාතික ආර්ථික සංවර්ධනයට දායක වීම වෙනුවෙන් වූ පිළිගැනීම සඳහා සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ සෙවනගල අංශය ජාතික කෘෂි ව්‍යාපාර සභාව විසින් 2014 ජාතික කෘෂි ව්‍යාපාර රන් සම්මානයෙන් පිදුම් ලැබීය.

. . . .

ශ්‍රී ලංකාවේ ආර්ථිකය වේගයෙන් ඉදිරියට යන අතර එහි සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමට හැකිවේ යැයි සතුටින් සඳහන් කරමි. රජයේ ප්‍රතිපත්ති හා පහළ පොලී අනුපාතයන් අපගේ නව ආයෝජන විකල්පවලට ආරාධනා කරයි. අපගේ නිෂ්පාදිතයට නිශ්චිත වෙළඳපොලක් ඇත. අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව උක් වගා බිම වැඩිකිරීමට ඉලක්ක කරයි. දැනට

සිටින ගොවීන් අභිප්‍රේරණය කිරීමෙන් හා කර්මාන්තයට නව ගොවීන් ගෙන ඒමෙන් ප්‍රතිඵල අත්කර ගැනීමට බලාපොරොත්තු වෙමි.

නව ඉඩම් අත්පත්කරගැනීම හා අප වගාවේ ඵලදායිතාව වර්ධනය කිරීමද වැදගත් වේ. ප්‍රධාන නිෂ්පාදනයට අමතරව මෙහෙයුම්වලින් උපරිම ඵල නෙලාගැනීමට අතුරු නිෂ්පාදන සංවර්ධනය කිරීම ඉලක්ක කළෙමු. අප විසින් සෙවනගල සහ පැල්වත්ත සඳහා සම උත්පාදන ව්‍යාපෘති ඇගයීමට ලක්කර ඇති අතර පිළිවෙලින් පැයකට මෙගාවොට් 10 සහ මෙගා වොට් 15 ක ධාරිතාවයකින් යුතු විදුලිය ජනනය කිරීමට නියමිතය.

ස්තුතිය

ඉකුත් අධ්‍යක්ෂ මණ්ඩලවලට කළමනාකාරීත්වයට සහ සමාගමේ කාර්ය මණ්ඩලයට 2015 සහ ඊට පෙර වර්ෂවලදී ලබාදුන් උත්සහාය හා වටිනා දායකත්වය සම්බන්ධයෙන් මාගේ ගෞරව පූර්ව ස්තුතිය සටහන් කර තැබීමට කැමැත්තෙමි.

තවද පසුගිය කාලය පුරාම සමාගම සමඟ සිටි උක් වගාකරුවන්, ගනුදෙනුකරුවන්, සීනි තොග වෙළඳුන්, බැංකු සහ රාජ්‍ය ආයතන වලටද මාගේ ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන් සමාගම සාර්ථකත්වය කරා මෙහෙය වූ නව අධ්‍යක්ෂ මණ්ඩලයට මාගේ ස්තුතිය පුදකරමි.

නවීන් අදිකාරම

සභාපති



අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරීගේ ප්‍රකාශය

හිතවත් සියලුම ඇල්මැති පාර්ශවකරුවනි,

ව්‍යාපාර පරිසරය

2015 වර්ෂයේදී මූල්‍ය තත්වයෙහි සෘණාත්මක බලපෑමක් පෙන්නුම් කරමින් සමාගම මිශ්‍ර ප්‍රතිඵල උදාකරගන්නා ලදී. පෙර වර්ෂවලදී ක්‍රියාත්මක කරන ලද මෙහෙයුම් පරිචයන් සමඟ 2014 වර්ෂයේදී අභිතකර බලපෑම් සෙවනගල හා පැල්වත්ත යන අංශ දෙකේම වගා ඵලදාව කෙරේ බලපෑවේය. මෝසම් වැසි නොලැබීමද මෙම තත්වය තවදුරටත් උග්‍ර අතට හැරීමට බලපෑවේය. සෘතුමය ලෙස උච්චාවචනය වන සීනි හා ENA වෙළඳපොල මිල වාසිය සමාගමට ලබාගැනීමට, විකුණුම් පරිපාටියක් නොමැති වීමද හේතු විය. 2015 වර්ෂය තුළදී දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොලෙහි සීනි කිලෝ ග්‍රෑම් එකකට රු.72 ක සහ, ENA ලීටරයකට රු.290 ක සාමාන්‍ය විකුණුම් මිලක් පවත්වාගෙන යාමට සමාගමට බල කෙරුණි. එකී සාධක හේතු කොටගෙන සමාගමට රු.බිලියනයකට අධික පාඩුවක් දැරීමට සිදු විය.

නව කළමනාකාරිත්වය

වඩා හොඳ ශක්තිසම්පන්න වර්ධනයක් ඉලක්ක කරමින් බරපතල මූල්‍ය බරක් උසුලාගෙන හා හෙක්ටයාරයකට පහල වගා අස්වැන්නක් සහිත සමාගම, නව කළමනාකාරිත්වය විසින් භාරගන්නා ලදී. කළමනාකාරිත්වය භාරගන්නා අවස්ථාවේදී හෙක්ටයාරයකට සාමාන්‍ය ඵලදාව මෙට්‍රික් ටොන් 60 මට්ටමේ පැවැති අතර එය කර්මාන්තයේ සාමාන්‍යයට වඩා අඩු මට්ටමකි. ඇඹරීමේ ක්‍රියාවලියේදී සිදුවන අධික කර්මාන්තශාලා පාඩු සහ 2015 දෙසැම්බර් මාසයේ පැවැති වියළි කාලගුණය ආදිය විශාල පාඩු ඇතිවීමට දායක වූ සාධක අතර ප්‍රධාන තැනක් ගත්තේය. අනෙකුත් සාධක නම්, අස්වැනු නෙලීම ප්‍රමාද වීම හා උක්ගස් වගාබිමේදීම පරණ වීමයි. (Staling) කෙසේ නමුත්, නව කළමනාකාරිත්වය එහි උපරිම මට්ටමෙන් ප්‍රධාන බාධකවලට ඇමතීමට තීරණය කළ අතර එහි දියුණු කළ හැකි ලාභදායීත්වය වැඩිකරමින් හානිදායක බලපෑම් අවමකිරීමට අපේක්ෂා කරයි.

තාක්ෂණික ((Technical)

මුදල් ප්‍රවාහ නිකුතූන් විසඳීම ස්ථිරව නහවුරු කිරීමට අතිවිශාල වැඩ කොටසක් තාක්ෂණික කණ්ඩායම සඳහා පිළියෙල කරන ලදී. මෙයට විධිමත් සහ විනිවිදභාවයෙන් යුතු විකුණුම් ක්‍රම විශ්ලේෂණය, සියලු කාර්මික කරුණු තාක්සේරු කිරීම 2016 වර්ෂය ආරම්භ වීමට පෙර 4% ට වැඩිව තිබූ කර්මාන්තශාලා පාඩුව නිශ්චිත ප්‍රමාණය කරා ගමන්කිරීම, අභිතකර කරුණු හඳුනා ගැනීම ආදියද ඇතුළත් වේ. ඉස්කාරයේ ගුණාත්මක තත්වයට අදාළ ප්‍රශ්න නිවැරදි කිරීමටද මෙම කාර්යයන් දීර්ඝ කරන ලදී. කොටසක් යාන්ත්‍රිකරණයෙන් මූලික උක්දඬු අස්වැනු නෙලන්නන් මඟින් අස්වැනු නෙලීම් ප්‍රමාදයන්ද අමතනු ලැබීය. එයින් අස්වැනු නෙලීම කඩිනම් කෙරේ. ඵලදාව පරණ වීම අවම කිරීමට හැකිවන පරිදි බර ඔසවන ඇණියක් (loader) එකතු කරන ලදී. කර්මාන්තශාලා, ඒවායේ ධාරිතාව වැඩිකිරීම සඳහා වැඩ මුර ක්‍රමයට හරවන ලදී. එමඟින්, වාරිමාර්ග සැලැස්ම හා අතිරේක වගා සැලසුම් හේතුකොට ගෙන ඇතුළට එන අතිරේක අස්වැන්න භාවිතා කිරීමට හැකිවිය.

මානව සම්පත

සමාගමේ සාර්ථකත්වය පදනම් වන්නේ එහි සේවකයින්ය. සමාගමේ සේවකයින් සමාගමේ වටිනාකම් සමඟ හසුරුවනු ලබන අතර ඔවුන්ගේ ආරක්ෂාව ඉලක්ක කෙරේ. අපගේ සේවකයින්, ගනුදෙනුකරුවන් විශිෂ්ඨත්වය, අවංකභාවය සහ අපගේ ප්‍රජා පුහුණුව හා සංවර්ධනය ඉතාමත් වටිනා සම්පත් දියුණු කිරීමට හා රඳවා ගැනීමේ ප්‍රධාන මෙවලම් වේ. පුද්ගල යන්නට අපගේ ගොවීන්ද ඇතුලත් වේ. එබැවින්, විධිමත් පුහුණු වැඩසටහන් ඉදිරි වර්ෂවලදී පවත්වාගෙන යාම කළමනාකාරිත්වයේ පරම ප්‍රමුඛත්වය වී ඇත.

සියලුම සේවකයන්ට හා කළමනාකාරිත්වයට ඔවුන්ගේ කැපවීම හා මහන්සි වී වැඩකිරීම සම්බන්ධයෙන් ස්තුති කිරීමට මම මෙය අවස්ථාවක් කරගනිමි. සමස්ත උත්සාහය බෙහෙවින් අගය කරන අතර සියලුම ඇල්මැති පාර්ශවකරුවන්ට (Stakeholders) වාසි සැලසෙන අයුරු එක් එක් අවස්ථාවන් ප්‍රශස්ත කිරීමට අපි දිගින් දිගටම කටයුතු කරමු.

එම් එච් ඒ සත්තාර්
අධ්‍යක්ෂ - ප්‍රධාන විධායක නිලධාරී

අවදානම් කළමනාකරණය

අවදානම් වර්ගය	විස්තරය	ක්‍රියාකාරී සැලැස්ම
මෙහෙයුම් අවදානම	උක්දඬු වගාව සඳහා ඉඩම් වෙන්කිරීම.	- උක්දඬු මිල රු.4,200 සිට රු.4,500 දක්වා වැඩිකිරීම. - අස්වැන්න සඳහා අත්තිකාරම් සහ ණය පදනම යටතේ අනෙකුත් ද්‍රව්‍ය පිරිනැමීම. - රජය හඳුන්වා දුන් පොහොර සහනාධාරය නිසා උක්ගොවීන්ටද වාසි අත්විය.
ණය අවදානම	ගොවීන්ට දෙන ලද යෙදවුම් හේතුකොට ගෙන බොල් ණය පැන නැඟීම.	ණය ආපසු අයකර ගැනීම සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලයට වැඩි වගකීම් පැවරීම.
උද්ධමන අවදානම	වැඩි වූ යෙදවුම් පිරිවැය හා පොදුකාර්ය පිරිවැය හේතුකොට ගෙන ලාභදායීත්වයට බලපෑමේ අවකාශය	ඵලදායීතාව වැඩිකිරීම හා නිෂ්පාදන පිරිවැය අඩුකිරීම ඉලක්ක කිරීම.
වෙළඳපොල අවදානම	දේශීය සීනි සපයන්නන් අඩු මිලට සීනි ආනයනය කිරීම.	ඒකකයක පොදුකාර්ය පිරිවැය අඩුකිරීම පිණිස නිෂ්පාදන ධාරිතාව වැඩිකිරීම.
පාරිසරික අවදානම	උක් අස්වැන්නට අලි ඇතුන්ගෙන් හා දේශගුණික වෙනස්වීම්වල බලපෑම, ඵලදාව අඩුවීමට හේතුවිය හැක.	සමාගමේ පිරිවැයෙන් අලි ඇතුන්ට එරෙහිව අගල් කැපීම, අලිවැට ඉදිකිරීම හා මිනිස් බාධක සංවර්ධනය කිරීම.

අප සංස්කෘතිය හා සාරධර්ම

අපේ රජු ගොවියාය. ගොවියා සමාගමේ ඉතාමත් ප්‍රබල වැදගත් ඇල්මැති පාර්ශවකරුවන්ගෙන් කෙනෙකු බව සමාගම විශ්වාස කරයි. සෑම ඉඩමක්ම පාහේ වගා කරන්නේ ගොවීන් නිසා සෙවනගලට අයත් වගා ඉඩම් සීමිත ප්‍රමාණයක් පමණක් තිබීම, සෙවනගලට තීරණාත්මක සාධකයක් වෙයි. හෙක්ටෙයාරයක උක් වගාවකින් මාසයකට ලබාගත හැකි සාමාන්‍ය ආදායම රු.35,000 ක් පමණ වන බව ඇස්තමේන්තු කර තිබුණි. බොහෝ ප්‍රදේශවල උක් වගාවේ නිරත ගොවීන්ගේ ආදායම පහළ මට්ටමක පැවතුණි. එම තත්වය ගොවීන් එම කර්මාන්තයේ රඳවා තබා ගැනීම අධෛර්යමත් කිරීමට හේතු විය. ඒ වෙනුවට ඔවුන් වෙනත් වගාවන්ට මාරු විය. ලංකා සීනි සමාගම මෙම තත්වය ආරම්භයේදීම හඳුනාගත් අතර ඔවුන්ගේ ආදායම වැඩිකිරීමට බොහෝ උත්සාහයන් ගනු ලැබීය. වර්තමානයේදී ගොවියෙකුට උක් මෙට්‍රික් ටොන් එකකට රු.4,500 ක් ගෙවනු ලබන අතර මීට පෙර එම මූදල මෙට්‍රික් ටොන් එකකට රු.4,200 කි. එබැවින්, මේ වනවිට උක් වගා ඉතිහාසයේ උක් මෙට්‍රික් ටොන් එකකට වැඩිම මිලක් ගෙවන ආයතනය බවට ලංකා සීනි සමාගම පත්වී ඇත. ගොවීන් උනන්දු කරවීම සඳහා සමාගමේ ලාභයෙන් 10% ක් උක් ගොවියාගේ දිරිගැන්වීම් සඳහා වෙන්කිරීමට 2013 වර්ෂයේදී කළමනාකාරිත්වය විසින් තීරණය කරන ලදී.

අපගේ ගනුදෙනුකරුවා

අපේ ගනුදෙනුකරුවා අපේ බලාපොරොත්තුවයි. අප ජනගහනයෙන් මිලියන 20 කට අධික සංඛ්‍යාවක් අපගේ ගනුදෙනුකරුවන් වේ. අපගේ මූලික අරමුණ වනුයේ මොවුනට ගුණාත්මක සීනි සාධාරණ මිලකට සැපයීමයි. ශ්‍රී ලාංකිකයකුගේ සාමාන්‍ය වාර්ෂික සීනි පාරිභෝජනය කිලෝග්‍රෑම් 30 – 35 අතර වේ. අපගේ නිෂ්පාදන ධාරිතාව 6% ක වැනි පහත් මට්ටමක පවතින බැවින් ඉතිරි 94% ක ප්‍රමාණය ආනයනය කිරීමට සිදු වේ. වර්ෂයකට එ.ජ.ඩොමි 250 කට අධික වියදමක් සීනි ආනයනය කිරීම සඳහා දරනු ලැබේ. මෙය අප ජාතික ආදායමට බරපතල ඍණාත්මක බලපෑමකි.

අපගේ සේවකයා

අපගේ සේවකයා අපේ ධනය වෙයි. පක්ෂපාතී, අභිප්‍රේරිත සේවක පිරිසකගෙන් තොරව කිසිදු සංවිධානයකට සාර්ථක වීමේ හැකියාවක් නැත. අප සේවකයින්ගේ කැපවීමේ හා උත්සාහයේ මට්ටම පිළිඹිබු වන්නේ මෙහෙයුම් ප්‍රතිඵලවලිනි. ලංකා සීනි සමාගමේ වැදගත් කේන්ද්‍රස්ථානයක් වනුයේ එහි මානව සම්පතයි. අතීතයේදී සීනි කර්මාන්තයේ යෙදී සිටි සේවකයින්ට ඔවුන්ගේ ජීවන රටාව තුළ රැකියා කොන්දේසි, පහත් මට්ටමේ මාසික ආදායම ප්‍රසාද දීමනා, උසස්වීම් ආදී ගැටලු සහිත අසීරු තත්වයන්ට මුහුණ දීමට සිදුවිය. මේ සම්බන්ධව දැනුවත් වී සමාගම මෙම ගැටලුවලට ඇමතීමට ප්‍රමුඛත්වය දී කටයුතු කළේය.

යහපාලනය

අපගේ ව්‍යවස්ථාපිත විගණක, විගණකාධිපති දෙපාර්තමේන්තුවයි. බාහිර විගණනයට අමතරව, පැල්වත්ත සහ සෙවනගල යන අංශ දෙකේම අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තු පිහිටුවා ඇති අතර එය ඍජුවම ප්‍රධාන විධායක නිලධාරී සහ සභාපතිතුමාට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත විගණන කමිටුව, අඛණ්ඩ පදනමක් මත අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනයට ලක්කර ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ පැහැදිලි කිරීම් ලබාගෙන, ඔවුන්ගේ සොයාගැනීම් සමඟ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කෙරේ.

සීමාවන් (Constraints)

නිරන්තරයෙන් අනාගතය කරා දිශානත වීම සඳහා ප්‍රධාන ගැටලු කීපයක් තවමත් විසඳිය යුතුව ඇත. සමාගමට අයත් නොවන වංචල වත්කම් හේතුකොට ගෙන පැල්වත්ත හා සෙවනගල යන පරිශ්‍ර දෙකම අවහිර වී ඇත. ඒවා ඉවත් කිරීමට හෝ ක්‍රියාවලියට අන්තර්ග්‍රහණය කිරීමට නෛතික කටයුතු අවසන් වනතුරු බලාසිටීමු. ඉඩම් අත්පත් කරගැනීමේ ක්‍රියාවලිය ඉතා හෙමින් සිදුවන අතර ප්‍රමාණවත් ඉඩම් ප්‍රමාණයක් පවරාගන්නා තුරු අපගේ දිගුකාලීන හා මධ්‍යකාලීන සැලසුම් අත්හිටුවීමට සිදු වී ඇත. මෙය කළමනාකාරිත්වයේ පාලනයෙන් බැහැර කර්තව්‍යයකි.

ශ්‍රී ලංකා රජය විසින් නියම කර ඇති ඉලක්ක සපුරාලීම සඳහා අවශ්‍ය උපායමාර්ග දැනටමත් කළමනාකාරණය විසින් සම්පාදනය කොට ඇත. නව ආයෝජනයට අරමුදල් සපයා ගැනීම සමාගමට තවත් ගැටලුවක් වී ඇත. බොහෝ බැංකු සැලකිය යුතු වත්කම් ප්‍රමාණයක් ඇප වශයෙන් තබාගන්නා නමුත් පැල්වත්ත හා සෙවනගල ඉඩම්වල අසීනිය ලංකා සීනි (පුද්) සමාගමට නැත. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ හා අමාත්‍යාංශයේ සහයෙන් අරමුදල් සපයා ගැනීමේ කාර්යයයේ නිරතව සිටී. පැල්වත්ත තොරතුරු පද්ධතිය තුල මෙහෙයුම් කටයුතුවල ඓතිහාසික හා වර්තමාන තොරතුරු තැන්පත්ව ඇත. එහෙත් සෙවනගල සේවක තොරතුරු සියල්ලක්ම පෙර කළමනාකාරිත්වය විසින් රැගෙන ගොස් ඇති හෙයින් සේවක පාරිතෝෂික දීමනා, ප්‍රතිපාදන සහ අනෙකුත් සේවකයන්ට සම්බන්ධ තොරතුරු රඳවා තබා ඇත. එබැවින්, සෙවනගල සීනි සමාගමේ පෙර කළමනාකරණය විසින් පවත්වාගෙන ගිය පොත්පත් හා ලිපිලේඛන ලබාගැනීමට රජය විසින් පියවර ගත යුතුව ඇත.

මිහිරි සවලත්වය

කරා පැහැදිලි මගක්



විගණන කමිටුවේ වාර්තාව

සමාගමේ විගණන කමිටුවේ සාමාජිකයින්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සමන්විත වේ. විගණන කමිටු රැස්වීම්, අවශ්‍යතාවය පරිදි මහා භාණ්ඩාගාරය නියෝජනය කරන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයාගේ සහභාගීත්වයෙන් රැස්කෙරේ. සභාපති, අධ්‍යක්ෂ, ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් ආරාධනයෙන් එම රැස්වීම්වලට සහභාගී වන අතර රැස්වීම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ සාමාන්‍යාධිකාරී (මානව සම්පත් හා පරිපාලන) විසිනි.

2015 අප්‍රේල් 28 දින සිට බලපැවැත්වෙන පරිදි පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්, විගණන කමිටුවට පත්කරනු ලැබීය. ඔවුන් 2015 වර්ෂයේදී වාර 2 ක් රැස්වූ අතර ඔවුන්ගේ පැමිණීමේ විස්තර පහත දැක්වේ.

	28.04.15	13.08.15	පැමිණි වාර ගණන
ටී.වී.වීරසේන මහතා විගණන කමිටු සභාපති අතිරේක අධ්‍යක්ෂ ජනරාල් මහා භාණ්ඩාගාර නියෝජිත	√	√	02 / 02
ඩී.වින්සන්ට් ඩයස් මහතා කමිටු සාමාජික අධ්‍යක්ෂ	√	√	02 / 02
ටී **විජය**ගුණවර්ධන මහතා කමිටු සාමාජික අධ්‍යක්ෂ	√	√	02 / 02

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම්

විගණන කමිටුවේ ප්‍රධාන කාර්යභාරය වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම, ඉදිරිපත් කිරීම හා ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් ඇතුළුව සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල හා මූල්‍ය වාර්තාකිරීමේ ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය හා විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් පාලන වගකීම ඉටුකිරීමයි.

තවද, කලින් කල මහා භාණ්ඩාගරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා මාර්ගෝපදේශ ඇතුළුව සමාගමේ අභ්‍යන්තර පාලනය සහ අවදානම්වල කළමනාකරණය ප්‍රමාණවත්ද සහ සමාගම විසින් නෛතික හා ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුකූලව කටයුතු කරන බවට තහවුරු කරගැනීම සඳහා ක්‍රියාවලීන් පිළිබඳ වගකීම් ඉටුකිරීමද ඇතුළත් වේ.

මූල්‍ය වර්ෂය තුළ ලත් ප්‍රගතිය

විගණන කමිටු රැස්වීම් වාර්තා සටහන්, අනුමැතිය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අඛණ්ඩව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරනු ලැබේ. විගණන කමිටුව, විගණන විෂය පථය, අරමුණුසහගත බව එහි ඵලදායීත්වය සමාලෝචනය සහ නිගමනය කරයි. කමිටුව, ලංකා සීනි සමාගමේ අනාගත අපේක්ෂාවන් සමඟ එහි මෙහෙයුම් සමාලෝචනයට ලක් කරයි.

කමිටුව විසින් මතුකරන ලද ගැටලුවලට ප්‍රතිචාර වශයෙන් කළමනාකාරීත්වය ක්‍රියාමාර්ග ගන්නා අතර පවත්නා අභ්‍යන්තර පාලන ක්‍රමයෙහි සඵලත්වය ගැන ව්‍යාපාර ඒකක ප්‍රධානීන්/ අධිකාරිවරුන් සමඟ සාකච්ඡා කර නිවැරදි ක්‍රියාමාර්ග නිර්දේශ කරනු ලැබේ.

ලංකා සීනි (පුද්) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව පිළිබඳ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර සමඟ, කළමනාකාරීත්වය සහ විගණකයින් සමඟ සාකච්ඡා කළ අතර, විගණකවරුන් විසින් ඉස්මතු කොට පෙන්වූ අසතුටුදායක ක්ෂේත්‍ර නිවැරදි කිරීමට පියවර ගන්නා ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් හඳුනාගන්නා ලද ව්‍යාපාර ඒකක දෙකෙහි අභ්‍යන්තර පාලන දුබලතා අත්වැරදි, ප්‍රධාන විධායක නිලධාරී සමඟ සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරීන් සමඟ සාකච්ඡා කොට වැදගත් ක්ෂේත්‍ර සුදුසු නිර්දේශ සමඟ ඉස්මතු කොට සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කරන ලදී. අභ්‍යන්තර විගණන අංශය විසින් ඉටුකරන ලද සේවය සහ සමාගමේ අවශ්‍යතා සහ අපේක්ෂාවන් ළඟා කරගැනීම සඳහා ඔවුන් දරන උත්සාහය සම්බන්ධයෙන් විගණන කමිටුවේ ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමු. විගණන කමිටු සාමාජිකයින් දෙන ලද දායකත්වය සම්බන්ධයෙන් කෘතඥතා පූර්වක ස්තුතිය පිරිනැමීමට කැමැත්තෙමි. ඔවුන්ගේ මූල්‍ය කරුණු පිළිබඳව ඇති ප්‍රවීනත්වය සහ අදාළ පළපුරුද්ද සමාගමේ අඛණ්ඩ සාර්ථකත්වය සඳහා මිලකළ නොහැකිය.

ටී.වී.වීරසේන
සභාපති - විගණන කමිටුව

මිහිරි සඵලත්වයෙ

රස බෙදහැරීමේ කාලය



අධ්‍යක්ෂ මණ්ඩලය



සභාපති
නවින් අධිකාරම මහතා



අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී
එම්. එම්. ඒ. සත්තාර් මහතා



අධ්‍යක්ෂ
තිසත් විජයගුණවර්ධන මහතා - නිතිඥ



අධ්‍යක්ෂ
ආර්. එම්. ගාමිණී රත්නායක මහතා



අධ්‍යක්ෂ
වින්සන්ට් ධයස් මහතා



අධ්‍යක්ෂ
ඒ. ඒ. විරසේන මහතා



අධ්‍යක්ෂ
ආචාර්ය නිහාල් සමරප්පුලි

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ තොරතුරු

අපේ සභාපතිවරයා

නවින් අධිකාරම මහතා - Central Missouri State University, Kansas City, Missouri, USA Bachelor of Science

සභාපති නවින් අධිකාරම මහතා සංස්ථාපනික පාලනය, ව්‍යාපාර ප්‍රතිව්‍යුහකරණය හා අක්‍රිය රාජ්‍ය ආයතන පුනුරුදය කිරීමේ හැකියාවක් ඇති පළපුරුදු උපායශීලී නායකයකු මෙන්ම ඉදිරි දැක්මක් ඇති සාර්ථක ව්‍යාපාරිකයෙකි. ඔහු තොරතුරු හා විදුලි සංදේශ තාක්ෂණය පිළිබඳ මනා දැනුමක් ඇති කළමනාකාරී විධායකයෙකු මෙන්ම බහු ජාතික, බහු සංස්කෘතික හා බහු වාර්ගික වාතාවරණයක් තුළ ශ්‍රී ලංකාව, ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, සිංගප්පුරුව, චීනය හා නේපාලය වැනි රටවල හා ලෝකයේ ප්‍රධාන පෙලේ සුපිරි සමාගම් 500ට අයත් සමාගම් සමඟ සබඳී ව්‍යාපාරික පළපුරුද්දක් ඇති ව්‍යවසායෙකි.

ඔහු පහත සඳහන් කමිටු සංවිධාන/සංවිධාන වල සේවය කරයි:

- ශ්‍රී ලංකාවේ නිරිත දිග විශ්ව විද්‍යාල කමිටුවේ සාමාජිකයෙකි.
- අධ්‍යක්ෂ - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
- අධ්‍යක්ෂ - සීමාසහිත ශ්‍රී ලංකා තානායම්
- කමිටු උපදේශක සාමාජික- ශ්‍රී ලංකා පාර්ශවය ව්‍යාපෘති කළමනාකාරී සමාගම

අපේ අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී

මොහමඩ් හිල්මි අබ්දුල් සත්තාර් මහතා

අපේ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී මොහමඩ් හිල්මි අබ්දුල් සත්තාර් මහතා කළමනාකරණ ක්ෂේත්‍රයේ වෘත්තීය වේදියෙකු වේ.

ප්‍රධාන කුසලතා

- අමාත්‍යාංශ කටයුතු සහ පරිපාලන කටයුතු පිළිබඳ පුලුල් දැනුමක් ඇත.
- දැනට පවතින ජාතික සහ අන්තර්ජාතික දේශපාලන කටයුතු සහ යහපාලනය පිළිබඳ පූර්ණ දැනුමක් ඇත.
- ලිඛිත සහ වාචික සන්නිවේදන ඉදිරිපත් කිරීමේ නිපුණයකි.
- ශක්තිමත් මාධ්‍ය කළමනාකාරිත්වය සහ මහජන සම්බන්ධතා පිළිබඳ නිපුණයකි.

වෘත්තීය පළපුරුද්ද

- අධ්‍යක්ෂක / ප්‍රධාන විධායක නිලධාරී, සී/ස ලංකා සීනි (පුද්ගලික) සමාගම
- අධ්‍යක්ෂ - සී/ස. ප්‍රිමියර් TK20 (පුද්ගලික) සමාගම
- උපදේශක (ආයෝජන) -ඛාන්ෆාරි සමූහය-ඕමානය (2009 සිට 2011 දක්වා)
- අධ්‍යක්ෂ - නිවාස අමාත්‍යාංශය (2004 සිට 2005 දක්වා)
- ගරු උපදේශක - රාජ්‍ය වෙළඳ සහ වාණිජ්‍ය අමාත්‍යාංශය යටතේ වන සමූපකාර තොග වෙළඳ සංස්ථාව (2002 සිට 2004 දක්වා)
- හවුල්කරු -TKS Trading , කොළඹ - (මෝටර් රථ බැටරි එකම ආනයනකරුවන් සහ රජයේ ප්‍රධාන සැපයුම්කරුවන්) (1995 සිට 2000 දක්වා)
- විධායක ගබඩා කළමණාකරු - සියන්කො සමූහයේ ජෙඩා වරාය ව්‍යාපෘතිය (1989 සිට 1993 දක්වා)

අධ්‍යක්ෂ මණ්ඩලය

තිසත් විජයගුණවර්ධන මහතා - නිහිඳු

තිසත් විජයගුණවර්ධන මහතා එංගලන්තයේ රීඩින්ග් විශ්ව විද්‍යාලයෙන් (University of Reading) නීති විද්‍යාව පිළිබඳව විද්‍යාපති (MSC) උපාධියක් ලබාගෙන ඇත. ඔහු සීමාසහිත චාන්සලර් උපදේශකවරු (පෞද්ගලික) සමාමේ සහ ජේ.ටී.ඇස්. පවර් සමාගමේ අධ්‍යක්ෂ/උපදේශක වශයෙන් සේවය කරයි. ඔහු 2012 ඔක්තෝම්බර් 1 වැනි දින අධ්‍යක්ෂක මණ්ඩලයට පත්කරනු ලැබීය.

ගාමිණී කුඩා බණ්ඩාර රත්නායක මහතා- Bachelor of Science, Master of Science – MAKS

ආර්. ගාමිණී කුඩා බණ්ඩාර රත්නායක මහතා ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ B.S.c. (කෘෂිකර්මය පිළිබඳ විශේෂිත) උපාධිය, ඉඩම් ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවර්ධන ඉඩම් ප්‍රතිසංස්කරණ සහ පුහුණු කිරීමේ ආයතනය තායිවානයේ සහ පිලිපීනයේ MAKS (කෘෂි-කර්මය පිළිබඳ දැනුම් පද්ධතියේ කළමනාකාරිත්වය), වැජනින්ජන්, නෙදර්ලන්ත සහතිකය (පුහුණුවීමේ පාඨමාලාව) වෝටර් ෂෙඩ් පුහුණුවීම නියගයට තුඩුදිය හැකි ප්‍රදේශ වලට විශේෂිත යොමු කිරීමක් සමඟ ග්‍රාමීය සංවර්ධන ගුහාටි, ඇසෑම්, ඉන්දියා (සංකලිත ආසියා සහ පැසිෆික් සහ ජාතික ග්‍රාමීය සංවර්ධන ආයතනය, ඉන්දියා) ජාතික ආයතනය ඇතුළුව සහතික ලබා ගන්නා ලදි.

බදුල්ලේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී දොන් වින්සන්ට් ඩයස් මහතා

දොන් වින්සන්ට් ඩයස් මහතා බදුල්ල එක්සත් ජාතික පක්ෂ සංවිධායක වශයෙන් 1975 තේරී පත්විය.

පළපුරුද්ද

- බදුල්ල එක්සත් ජාතික පක්ෂ සංවිධායක වශයෙන් 1975 තේරී පත්විය.
- බදුල්ලේ පාර්ලිමේන්තු මන්ත්‍රී වශයෙන් 1977 තේරී පත්විය.
- ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය ඇමති ලෙස 1983 දී තේරී පත්විය.
- 1993 සිට 1994 ITN හි ක්‍රියාකාරී අධ්‍යක්ෂක
- සභාපති ඖෂධ සංස්ථාව 1994
- 1993 - 2009 උඩව පළාත් සභාවේ සාමාජිකයෙකි.
- 2015 - අධ්‍යක්ෂ ලංකා සීනි සමාගම සහ ලංකා සළුසල

ඒ.වී. විරසේන මහතා මහතා - B com (විශේෂ) උපාධිය, ගණකාධිකාරී සහ මූල්‍ය කළමනාකරණය

වෘත්තීය සුදුසුකම්

- ශ්‍රී ලංකාවේ ගණකාධිකාරිවරුන්ගේ රාජ්‍ය මුල්‍ය ගිණුම් සංගමයේ සමාජිකත්වය දරයි
- උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව - (කාර්මික විද්‍යාලය)
- රාජ්‍ය මුල්‍ය කළමණාකරන ඩිප්ලෝමාව - (SLIDA)
- වරලත් ගණකාධිකරණය - අවසානය
- වෘත්තීය ඉංග්‍රීසි ඩිප්ලොමාව - (SLIDA)
- ව්‍යාපාර අධ්‍යනය ඩිප්ලොමාව කාර්මික විද්‍යාලය

ආචාර්ය නිහාල් සමරජපුලි - B.Sc. (Special Degree in Agriculture), MSc. (Agricultural Extension), PhD (Economics)

ආචාර්ය නිහාල් සමරජපුලි ප්‍රධාන පෙලේ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනවල අවුරුදු 35 කට වඩා වැඩි ක්‍රියාකාරී පළපුරුද්දක් ඇති ආර්ථික විද්‍යාර්තකයෙකු හා ප්‍රතිපත්ති සම්පාදකවරයකි. එසේම ඔහු අන්තර් ජාතික සංවිධාන වල උපදේශකවරයෙකු වශයෙන් සේවය කර ඇති අතර ආසියා සංවර්ධන බැංකුව සහ අන්තර් ජාතික කෘෂිකාර්මික සංවර්ධන අරමුදල (IFAD) වැනි ආයතනවල ඔහු විසින් ගැඹුරු පර්යේෂණ පත්‍රිකා ප්‍රසිද්ධ කර ඇත. එසේම සංවර්ධන සැලසුම් එසේම ප්‍රතිපත්ති විශ්ලේෂණ, ආයෝජන සහ වෙළඳ ප්‍රවර්ධනය අන්තර් ජාතික සම්මුති සාකච්ඡා සිදු කර ඇත.

වෘත්තීය පළපුරුද්ද

- ටෝකියෝ සිමෙන්ති කම්පැනි (ලංකා) PLC කොළඹ 03, ශ්‍රී ලංකා (අධ්‍යක්ෂ - ආර්ථික පර්යේෂණ) 2015
- ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය (අධ්‍යක්ෂ ජෙනරාල් - ආයෝජන) 2013-2014
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (විධායක අධ්‍යක්ෂ - පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශනය) 2001-2014
- ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (අධ්‍යක්ෂ - පර්යේෂණ) 1998-2001
- ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය, ඩර්ටන්ෆීල්ඩ්, අඟලවත්ත, ශ්‍රී ලංකාව (කෘෂි ආර්ථික විද්‍යාඥ)
  ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (විධායක අධ්‍යක්ෂ - පර්යේෂණ සහ ප්‍රතිපත්ති උපදේශනය) 1991-1998
- රබර් පර්යේෂණ මණ්ඩලය-නිවිතිගලකැලේ, මතුගම, ශ්‍රී ලංකා (පුහුණු කිරීමේ නිලධාරී) 1981-1991
- මහවැලි සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා (සහකාර පාංශු රසායනඥ) 1979-1981

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම සහ ප්‍රධාන කාර්යාල සංවිධානයේ ව්‍යුහය



සභාපති
නවින් අධිකාරම මහතා



අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි
එම්. එම්. එ. ගප්හාර් මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - පැල්වත්ත
පී. එම්. එ. ඩබ්. කරුණාරත්න මහතා



ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - සෙවනගල
ඒ. ඊ. අමුණුගම මහතා



කොමර්ෂල් අධිකාරි - ප්‍රසම්පාදන
ඩබ්ලිව්. ඇම්. කරුණාරත්න මහතා



මූල්‍ය කොමර්ෂල් අධිකාරි
එස්. එච්. එස් නවරත්න මහතා



මානව සම්පත්/නිරීක්ෂණ
එම්. ජයකොඩි මහතා



ජ්‍යෙෂ්ඨ කළමණාකරු ඉඩම් අත්පත් කර ගැනීම්
එස්. පේ. රත්නායක මහතා

සංවිධානයේ ව්‍යුහය - පැල්වත්ත



පැල්වත්ත කළමනාකරණ කණ්ඩායම



පළමු පෙළ (වමේ සිට දකුණට)

එම්.ඊ. කොස්ගහකුඹුර මහත්මිය (ගණකාධිකාරී කළමනාකරණය) ඩී.එන්. දයාරත්න මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලා) එම්.පී.එන් සඳරුවනි (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -මූල්‍ය) බී.ඒ.ජී.එන්. ඉලංගකෝන් මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මෙහෙයුම්) විමල් කරුණාරත්න (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී) ඩී.එල්.ඩී. ජයන්ත (සමාන්‍යාධිකාරී - ඉස්කාගාර) එම්.එම්.ඩී.එස්.එන්. පෙරේරා මහතා (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී -කෘෂිකර්ම) ලිලී එම්. හෙට්ටිආරච්චි මෙනවිය (සංස්ථාපිත තොරතුරු විධායක නිලධාරී)

දෙවන පෙළ (වමේ සිට දකුණට)

එස්. වීරසේකර මහතා (ගොල්ෆ් සහ හෝටල් සංකීර්ණ කළමනාකරු) ආර්.එම්.ජේ. බණ්ඩාර (නිෂ්පාදන කළමණාකරු -නිෂ්පාදනය) ඩී.ඒ. චන්ද්‍රරාජ් (විදුලි ඉංජිනේරු කර්මාන්තශාලා) කේ.එල්.ජේ. ප්‍රනාන්දු (කළමනාකරු මානව සම්පත්) එච්.එම්.අයි.ඒ.කේ. කටුගහ (නිෂ්පාදන කළමනාකරු කර්මාන්තශාලා) කේ.විදුරසිංහ (කළමනාකරු අස්වැන්න සහ මිලදී ගැනීමේ අංශය) එන්. විමලසේන (ප්‍රධාන විමර්ෂණ නිලධාරී) මාලින්ද ද සිල්වා (සහකාර කළමනාකරු EP) බී.ජී.ටී. ප්‍රසංග (කළමනාකරු මානව සම්පත් සහ පරිපාලන)

තුන්වනපෙළ (වමේ සිට දකුණට)

එල්.ඒ.සී. ප්‍රසන්න මහතා (කළමනාකරු NE) කේ.ඒ.ජී.එස්. සිසිවත් (ඉංජිනේරු කළමනාකරු-කර්මාන්තශාලා) ඩබ්.එස්.කේ. රත්නායක (කළමනාකරු- ඉඩම් සංවර්ධන) ඩී.එම්.එස්. බණ්ඩාර (කළමනාකරු-පිටස්තර වැවිලි කටයුතු) ඊ.පී. සුරංග (කළමනාකරු -කර්මාන්තශාලා) ඒ. මාසාච්චි (ප්‍රධාන අභ්‍යන්තර විගණක) ආර්.ඒ.එම්. චන්දන (සස්‍ය විද්‍යාඥ) අනුර විජේසිංහ (කළමනාකරු -මිලට ගැනීම) කේ.ඒ.ජී. පලන්සූරිය (කේන්ද්‍රිය වතු) එම්.බී. චන්දන (ප්‍රධාන ඉංජිනේරු)

සංවිධානයේ ව්‍යුහය - සෙවනගල



V = අබිරහුවක් ඇත.

සෙවනගල කළමනාකරණ කණ්ඩායම



ඉදිරි පෙළ වමේ සිට දකුණට

ඇන්.ඒ. විමලරත්න මහතා (වැඩබලන යන්ත්‍රෝපකරණ කළමනාකරු), ජේ.ආර්. මාලගොඩ මහතා (සහකාර සාමාන්‍යාධිකාරී - සිවිල් ඉංජිනේරු සේවා), ඩී.කේ.ඩබ්ලිව්.ඩී සිල්වා මහතා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - කර්මාන්තශාලාව), සී.ඊ. අමුණුගම මහතා (ප්‍රධාන මෙහෙයුම් නිලධාරී), කේ.ඒ. චොල්ටර් (සාමාන්‍යාධිකාරී), එච්.ඇම්.ඇස්. සමරවීර (නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-කෘෂිකර්ම), ඇස්.වී.ඩී. ප්‍රියන්ත (ප්‍රධාන ඉංජිනේරු)

පසු පෙළ දකුණේ සිට වමට

ඇස්.ඩබ්ලිව්. කොඩිතුවක්කු (කළමනාකරු කෘෂිකර්ම දිගුව), පී.ඒ.කේ. නන්දවැව මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ඇම්. උපුල් කුමාර මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), අතුල සිරිදේව මහතා (කළමනාකරු කෘෂිකර්ම දිගුව), ඩී.සී. හෙට්ටිආරච්චි මහතා (ප්‍රධාන ඉංජිනේරු - බලශක්තිය සහ වැඩපොළ), ජයන්ත ෆර්නෑන්ඩෝ මහතා (ජෙයෂ්ඨ කළමනාකරු - මානව සම්පත්), සඳුමල් පිහිල්ලේගෙදර මහතා(කළමනාකරු - ප්‍රසම්පාදන සහ අලෙවිකරණය), ඇම්. ශාන්ත වීරසිරි මහතා (අභ්‍යාන්තර විගණක/විමර්ෂණකරු), කිංස්ලි පතිරණ මහතා (ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරයා)

ලංකා සීනි (පුද්) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගමේ ("සමාගම") 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතුයැයි මා අදහස් කරන මගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 සමාගම පිහිටුවීම හා අයිතිය

සීමාසහිත ලංකා සීනි පුද්ගලික සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සීමිත වගකීම් සමාගමක් වන අතර 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ යළි ලියාපදිංචි කර ඇත. මෙය සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන අතර භාණ්ඩාගාරයේ ලේකම් සමාගමේ නාම කොටස් හිමිකරු වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ (මණ්ඩලය) වගකීම වේ.

1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS / SLFRS)

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 10 - වාර්තා කරන කාල පරිච්ඡේදයට පසු සිදුවීම්

මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරනු ලැබූ දිනය හෙළිදරව් කළ යුතු වුවද සමාගම එයට අනුකූල වී නොතිබුණි.

(ආ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 24 - සම්බන්ධිත පාර්ශව හෙලිදරව් කිරීම්

සමාගමේ සම්බන්ධිත පාර්ශවයන්ට අදාළ ගනුදෙනු පිළිබඳ තොරතුරු සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හා අසම්භාව්‍ය වත්කම්

ප්‍රමිතිය ප්‍රකාරව, ආයතනය සම්බන්ධව ඇති නඩුවල වර්තමාන තත්ත්වය සලකා බලා මූල්‍ය තත්ත්ව ප්‍රකාශන දිනට පවතින අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. කෙසේ වෙතත් සමාගම එයට අනුකූලවී නොතිබුණි. තවද, පවත්නා නඩු පිළිබඳව තහවුරු කර ගැනීම සඳහා නීතීඥවරුන්ගේ සනාථන ලිපි ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඈ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 39 - මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා මැනීම

ප්‍රමිත 09 (ii) , 46 (අ) හා (ආ) ඡේද ප්‍රකාරව, සේවක ණය සහ අනෙකුත් ණයගැති ශේෂ සඵල පොලී අනුපාතය ක්‍රමය යටතේ ගලපා ගිණුම්ගත කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය. තවද, කල් පිරෙන තෙක් තබා ගනු ලබන ස්ථාවර වත්කම් කල් පිරෙන තෙක් තබා ගැනීමට අදහස් කරන "ආයෝජන" යටතේ වර්ගීකරණය කල යුතු අතර සඵල පොලී අනුපාත ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්කරණය කර මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගත යුතුය. කෙසේ වෙතත් සමාගම එයට අනුකූල වී නොතිබුණි. එසේම මූල්‍ය ප්‍රකාශනවල ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු. 910,838,300 ක් වටිනා තැන්පතු ප්‍රමිතියේ 9 හා 45 ඡේද ප්‍රකාරව වර්ගීකරණය සහ මිනුම්කරණය කර නොතිබුණි.

(ඉ) ශ්‍රී.ලං.ගි.ප්‍ර. 41 - කෘෂිකර්මය

ජීව විද්‍යාත්මක පරිවර්තනයන් හඳුනාගෙන ජංගම නොවන වත්කම් යටතේ ජීව විද්‍යාත්මක වත්කම් ලෙස ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව දැක්විය යුතු වුවද සමාගම විසින් රු. 624,198,372 ක් වටිනා ජීව විද්‍යාත්මක වත්කම්, ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ජීව විද්‍යාත්මක වත්කම්වලට අදාළ විස්තර හෙළිදරව් කර නොතිබුණු බව තවදුරටත් නිරීක්ෂණය විය. ප්‍රමිතියට අනුව ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ අගයට ගණනය කර ගිණුම්වල හඳුනාගත යුතු වුවද උක්වගාව සඳහා දරන ලද සත්‍ය වියදම ගණනය කර එහි වටිනාකම ජීව විද්‍යාත්මක වත්කම් වශයෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ඊ) ශ්‍රීලංමූවාප්‍ර 07- මූල්‍ය උපකරණ හෙළිදරව් කිරීම

හානිකරණය සඳහා ප්‍රතිපාදන, සැසඳීමක් ලෙස වෙනම ඉදිරිපත් කළ යුතු වුවද, සමාගම විසින් අඩමාණ ණය ඍජුවම වත්කම් වලින් අඩුකර ගොවීන්ගෙන් අයවිය යුතු ණය යටතේ දක්වා තිබුණි.

(උ) ශ්‍රීලංමූවාප්‍ර 08 - මෙහෙයුම් අංශ

ප්‍රමිතියේ 22 සහ 28 ඡේද ප්‍රකාරව වාර්තාකරණ අංශයන්ට අදාළව සිදුකළ යුතු හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමට අයත් සෙවනගල සීනි කර්මාන්තායතනයෙහි ස්ථාවර වත්කම් ලේඛනය තුළ රු. 14,170 ක ඍණ අගයක් ගත් වත්කමක් පැවතුණි.

(ආ) සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබූ ඉඩම් සංවර්ධනය සඳහා සමාගමේ ක්ෂය ප්‍රතිපත්තිය වාර්ෂිකව සියයට දෙකක් බැගින් ක්ෂය කිරීම වුවද, මහවැව ව්‍යාපෘතියේ රු.8,384,151 ක් වටිනා ඉඩම් සංවර්ධනයන් සඳහා වාර්ෂිකව සියයට හතර බැගින් ක්ෂය කර ගිණුම්ගත කර තිබුණි.

(අ) සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළව ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති රු. 760,763,929 ක ශේෂය ඒවා මිලට ගත් දිනයන් නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහා ක්ෂය ගලපා තිබුණි.

(ආ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ කල්බදු ගිවිසුම් 08 කට අදාළව රු. 19,038,439 ක් වූ ගෙවිය යුතු පොලී වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) යල් පැන තිබූ තොග සඳහා වෙන්කිරීම් හඳුනාගැනීමට ඉන්වෙන්ට්‍රි විෂයයන් සඳහා කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණු අතර සමාගමේ සෙවනගල සීනි කර්මාන්තායතනයට අයත් ඉන්වෙන්ට්‍රි විෂයයන් අයිතම පහක රු. 36,435,394 ක ඍණ වටිනාකමක් තිබුණි.

(ඊ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශනවල "තක්සේරු ගැලපීම්" ලෙස රු.1,847,711 ක් අඩු කර රු. 4,813,390 ක් එකතු කර විකුණුම් පිරිවැය ගණනය කර තිබුණි. එම නිසා නිවැරදි පිරිවැය ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය නොකර ගණනය කර ඇති පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මුළු විකුණුම් පිරිවැය වූ රු. 3,710,632,390 ක නිවැරදිනාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

(උ) පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතනයන්හි ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇති වත්කම් වලින් පෙර පැවති කළමනාකරණයට අයත් වත්කම් හඳුනාගැනීමට නොහැකි වූ අතර එම වත්කම් ප්‍රත්‍යාගණනය කර නොමැති බැවින් එම වත්කම්වල සාධාරණ අගය නොදැක්වුණි.

(ඌ) ආදායම් බදු හා විලම්බිත බදු ගණනය කිරීම 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධාන වලට අනුකූලව සිදුකර නොතිබුණි.

2.2.3 හඳුනා නොගත් වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාගමට අයත් සෙවනගල සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති පිරියත හා යන්ත්‍රෝපකරණ ශුද්ධ ශේෂය රු. 440,242,580 ක් වුවද, උපලේඛන අනුව එය රු. 430,194,601 ක් වූයෙන් රු. 10,047,979 ක වෙනසක් තිබුණි.

(ආ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි ස්ථාවර වත්කම් ලේඛනයෙහි දැක්වෙන පිරිවැය ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ ක්ෂේත්‍ර පිරියත උපකරණ සහ වාහන පිරිවැය පිළිවෙලින් රු. 442,730 ක හා රු. 442,924 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රධාන කාර්යාලය විසින් ගෙන තිබූ පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතනයන්ට අදාළ ශේෂයන්, විගණනය සඳහා එම කර්මාන්තායතනයන් විසින් ඉදිරිපත් කල ගිණුම්වල සඳහන් ශේෂයන් අතර වෙනස්කම් පැවතුණි. ඒ අනුව පැල්වත්ත සීනිකර්මාන්තායතනයේ ගිණුම් ශේෂයන් 4 කට අදාළව රු.67,560,469 ක වෙනසක් සහ සෙවනගල සීනි කර්මාන්තායතනයේ ගිණුම් ශේෂයන් 5 කට අදාළව රු. 26,435,833 ක වෙනසක් පැවතුණි.

(ඈ) සෙවනගල හා පැල්වත්ත සීනි කර්මාන්තායතනවල මූල්‍ය ප්‍රකාශන අනුව, සෙවනගල සීනි කර්මාන්තායතනයට ගෙවිය යුතු ශේෂයේ රු.1,084,930 ක වෙනසක්ද, ප්‍රධාන කාර්යාලයට ගෙවිය යුතු ශේෂයේ රු. 2,000,390 ක වෙනසක්ද පැවතුණි. ඉහත සඳහන් මූල්‍ය ප්‍රකාශන අනුව, ප්‍රධාන කාර්යාලයෙන් ලැබිය යුතු ශේෂයේ රු. 45,596,272 ක වෙනසක්ද පැවතුණි.

2.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2.2.4.1 ලැබිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගොවීන්ගෙන් අයකර ගත යුතු වූ 1987 සිට ගිණුම්වල පැවත එන රු. 592,930,256 ක් වූ ලැබිය යුතු දිගුකාලීන හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා ඇති වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂ තුළ 2012 වර්ෂයේ සිට පැවත එන සේවක සමාජ ශාලාවෙන් ලැබිය යුතු රු. 1,578,177 ක හිඟ ශේෂයන්ද පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශන මඟින් අනාවරණය වූ 2012 වර්ෂයේ සිට පැවත එන අත්තිකාරම් හා පෙර ගෙවුම් ශේෂ තුළ දක්වා තිබූ රු. 2,564,708 ක ශේෂයක්ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමට අයත් පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අත්තිකාරම් හා පෙර ගෙවුම් ශේෂ තුළ 2013/2014 වර්ෂ වලදී සැපයුම්කරුවන්ට ලබාදෙන ලද රු.1,348,314 ක ශේෂ ඇතුළත් වී තිබූ අතර එම ශේෂ අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඇ) කාල විශ්ලේෂණයක් මඟින් බොල් හා අඩමාන ණය වෙනුවෙන් ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණු අතර සෙවනගල සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ගොවීන්ගෙන් අයකරගත යුතු රු. 319,114,107 ක ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ණයගැති ගිණුම් වටිනාකම තුළ රු. 50,225 ක බැර ශේෂ ද ඇතුළත්ව තිබුණි.

(ඉ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අත්තිකාරම් හා පෙර ගෙවුම් ශේෂය තුළ 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු. 26,304,842 ක මාර්ගස්ථ තොග ඇතුළත් කර තිබූ අතර එම ශේෂය 2015 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

(ඊ) රජයට පවරාගැනීමට පෙර පැවති කළමනාකරණය විසින් ගොවීන් වෙත ලබා දී තිබූ ණය පහසුකම් පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගිණුම් ගත කර තිබුණු නමුත් සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් එය හදුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

2.2.4.2 ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි ණයගිමි පාලන ගිණුම තුළ 2011 වර්ෂයේ සිට ණයගිමි ශේෂ රු. 67,403,708 ක් ඇතුළත්ව තිබූ අතර එම ශේෂ නිරවුල් කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ආ) නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව වසරකට වඩා වැඩි කාලයක් අපේක්ෂිත වියදම් ගිණුමක් ලෙස රු.3,972,068 ක ශේෂ පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙහි වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ගිණුම් තුළ ඇතුළත් කර තිබුණි.

(ඇ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළ වෙළඳ හා වෙනත් ගෙවිය යුතු ශේෂ තුළ 2011 වර්ෂයේ සිට ගෙවිය යුතු රු. 13,658,977 ක සේවක අර්ථසාධක අරමුදල් අධිභාරයක් ඇතුළත්ව තිබූ අතර ගෙවිය යුතු සේවක දිරිදීමනා හා ගොවීන් වෙත ගෙවිය යුතු දිරිදීමනා පිළිවෙලින් රු. 56,999 ක් හා රු.2,225,407 ක ශේෂ එම ශේෂය තුළ ඇතුළත්ව තිබුණි.

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ලංකා සතොස වෙත ගෙවිය යුතු රු. 8,086,000 ක ශේෂයක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) හිමිකම් නොපෑ වේතන නිරවුල් කිරීමේදී අක්‍රමිකතා සිදුවිය හැකි බැවින් කෙටිකාලීන ක්‍රියාමාර්ග ගත යුතු වුවත් එකතුව රු. 4,074,921 ක් වූ එම ශේෂ වසරකට වඩා වැඩි කාලයක් පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ගිණුම්වල පැවතුණි.

(ඊ) සෙවනගල සීනි කර්මාන්තායතනයට අදාළව මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණයහිමියෝ යටතේ වසරකට වඩා වැඩි කාලයක් දක්වා තිබූ රු. 152,132 ක ශේෂ නිරවුල් කිරීමට සමාගම විසින් කටයුතු කර නොතිබුණි.

(උ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අදාළ රු. 160,442,120 ක් වූ ජාතිය ගොඩ නැගීමේ බදු (NBT) ශේෂය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කිරීමෙන් තොරව විවිධ ණයහිමියන් තුළ ඇතුළත් කර තිබුණි.

(ඌ) ගොවීන්ගෙන් ලද රු. 59,822,499 ක පැරණි බැර ශේෂ සෙවනගල සීනි කර්මාන්තායතනයේ මූල්‍ය ප්‍රකාශනවල විවිධ ණය හිමියන් වශයෙන් සාවද්‍යව දක්වා තිබුණි.

2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පහත සඳහන් විෂයයන් වලට අදාළව ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

ගිණුම් විෂයය	වටිනාකම රු.	ඉදිරිපත් නොකළ සාක්ෂි
හෝටල් ව්‍යාපෘති ශේෂය - පැල්වත්ත සීනි කර්මාන්තායතනය	74,821,594	වටිනාකම තහවුරු කර ගැනීමට අදාළ උපයෝගී ලියවිලි
අපහරණය කළ ක්ෂේත්‍ර පිරියත හා උපකරණ(Field plant and equipment) - පැල්වත්ත සීනි කර්මාන්තායතනය	210,000	
ප්‍රවර්තන වර්ෂයේ ගැලපුම්	4,170,957	
බැංකුව වෙත ගෙවිය යුතු කල්බදු	11,812,500	බැංකු සනාථන ලිපි

2.2.6 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව		අනුකූල නොවීම
(අ). 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය		
	I 9.2 ඈ' ඡේදය	සංවිධාන ව්‍යුහය හා අනුමත කාර්ය මණ්ඩලය භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත්, සමාගමේ ප්‍රධාන කාර්යාලය හා ඊට අයත් පැල්වත්ත සහ සෙවනගල සීනි කර්මාන්තායතනයන් එයට අනුකූල වී නොතිබුණි.
	II. 5.2.5 ඡේදය	ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවසාන අයවැය ලේඛනයේ පිටපතක් අදාළ වර්ෂය ආරම්භ වී දින 15 ක් ගත වීමට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද 2016 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික අයවැය ලේඛනයේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
	III. 6.5.1 ඡේදය	මූදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද සමාගම විසින් එහි ගිණුම් ඉදිරිපත් කර තිබුණේ ගිණුම් වර්ෂය අවසන් වී මාස 5 ක් සහ දින 20 ක ප්‍රමාදයකින් පසුවය.
(ආ) 2008 ජූනි 26 දිනැති අංක 14/2008 හා 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය		I. පෞද්ගලික ගමන් සඳහා නිල වාහන පාවිච්චි කිරීමට හිමිකම් ඇති නිලධාරීන්ට රු. 30,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් හා අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාවක් පමණක් ගෙවිය හැකිය. කෙසේවෙතත්, එම චක්‍රලේඛයේ විධිවිධානයන්ට පටහැනිව හා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක්ද නොමැතිව ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් 04 දෙනෙකුට 2015 වර්ෂය සඳහා රු. 240,000 ක්ද, පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිලධාරීන් 8 දෙනෙකුට රු. 838,000 ක මුදලක් ද වැඩිපුර ගෙවා තිබුණි.
		II. ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලබන නිලධාරීන්, රියදුරෙක් හෝ රියදුරු දීමනාවක් සඳහා හිමිකම් නොලබන නමුත්, පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) විසින් ආයතනයේ ස්ථිර සේවයේ නියුතු රියදුරෙකු තම වාහනයේ රියැදුරු ලෙස සේවයේ යොදවා ගෙන ඇති අතර ඔහු වෙනුවෙන් 2015 වර්ෂයේදී සමාගම ගෙවා ඇති මුළු වැටුප රු. 488,542 ක් විය. තවද කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ට වෙන්කර තිබූ යාලබෝව නිවාස සංකීර්ණයේ නිවසක් එම රියදුරුට ලබා දී තිබුණි.
(ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය		ජාතික පාරිසරික පනත ප්‍රකාරව, සෙවනගල සීනි කර්මාන්තායතනය සඳහා පරිසර ආරක්ෂක බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි.
ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2.14.1 සහ 3.2.1 මාර්ගෝපදේශය		පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් රු. 128,910,000 ක් වටිනා දොඹකර යන්ත්‍රයක් ප්‍රසම්පාදනය කිරීමේදී අමාත්‍යාංශ ප්‍රසම්පාදන

කමිටුවේ අනුමැතියක් ලබාගෙන නොත්බුණු අතර ජාත්ක තරඟකාරී ලංසු කැඳවීම් වෙනුවට වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කර තිබුණි.

3.2.1 මාර්ගෝපදේශය

සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් රු. 17,400,000 ක් පිරිවැය වූ දොඹකර යන්ත්‍රයක් මිලදීගැනීමේදී දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

3.4.1. (අ) සහ 7.12.2 (අ) මාර්ගෝපදේශය

වෙළඳපොළ මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කළ යුත්තේ වටිනාකම අඩු හා වහාම ලබාගත යුතු හදිසි භාණ්ඩ සඳහා වුවත් සෙවනගල කර්මාන්තායතනය විසින් "ෂාප්ට් මවුන්ට් ගියර් බොක්ස්" (Shaft Mount Gear Box) දෙකක් රු. 11,872,000කට මිලදී ගැනීමේදී වෙළඳපොළ මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කර තිබූ අතර ලංසු කැඳවීම් සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දී නොතිබුණි.

2.2.7 බලය නොලත් ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව සමාගමේ ප්‍රධාන විධායක නිලධාරිගේ අනුමැතිය මත පමණක් පදනම්ව සෙවනගල සීනි කර්මාන්තායතනයේ, සමාගමේ ප්‍රධාන කාර්යාලයේ හා පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ඉහළ කළමනාකරණය විසින් පිළිවෙලින් රු. 1,920,000 ක් , රු. 1,560,000 හා රු. 22,537,806 ක් විවිධ දීමනා වශයෙන් ලබාගෙන තිබුණි.

(ආ) 2015 අගෝස්තු 24 දින තීරණය කරන ලද මිලට වඩා අඩු මිලගණන් යටතේ එතනෝල් අලෙවි කිරීම නිසා පැල්වත්ත සීනි කර්මාන්තායතනයෙන් රු. 31,218,000 ක් හා සෙවනගල සීනි කර්මාන්තායතනයෙන් රු. 15,000,000 ක් ලෙස සිදු වී ඇති මුළු අලාභය රු. 46,218,000 ක් විය. එසේම එතනෝල් සඳහා නිශ්චිත අලෙවි මිලක් තීරණය කර නොතිබුණු අතර එම කාලය තුළ එක් එක් ආයතනවලට විවිධ මිල ගණන් යටතේ එතනෝල් අලෙවි කර තිබුණි.

(ඇ) ප්‍රධාන කාර්යාලය විසින් වියදම් කිරීමට නිසි අධිකාර බලයක් ලබා නොගෙන රු.4,002,360 ක් හා රු. 6,665,725ක් පිළිවෙලින් බදුල්ල සහ කන්තලේ ව්‍යාපෘති වියදම් දැරීමට සෙවනගල සීනි කර්මාන්තායතනයෙන් ලබා ගෙන තිබුණි.

(ඈ) 2014 වර්ෂයේදී සෙවනගල සීනි කර්මාන්තායතනය වෙතින් රු. 26,462,500 ක මුදලක් ලබාගෙන සමාගමේ ප්‍රධාන කාර්යාලය විසින් පෞද්ගලික බැංකුවක ස්ථීර තැන්පතුවක් ආරම්භ කර තිබුණි. කල් පිරීමට ප්‍රථම එම තැන්පතුව 2016 මාර්තු 13 දින ආපසු ලබා ගැනීම නිසා රු. 870,000 ක පොලියක් අහිමි වී තිබුණි.

(ඉ) සෙවනගල සීනි කර්මාන්තායතනයෙන් ප්‍රධාන කාර්යාල ගිණුමට මාරු කර තිබූ රු.10,600,000 ක මුදලින් රු. 10,048,000 ක් පිරිවැය වූ වාහනයක් ප්‍රධාන විධායක නිලධාරී වෙනුවෙන් ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේ වුවද එම මුදල මාරු කිරීමට හෝ වාහනය ප්‍රසම්පාදනය කිරීමට අනුමැතියක් ලබා දී නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. 1,052,439,824 ක බදු පෙර ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ පාඩුව රු. 211,012,935 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 841,426,889 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ආදායම රු. 657,667,601 කින් අඩුවීම, සහ විකුණුම් පිරිවැය රු. 160,665,253 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 සමාගමේ අගය එකතු කිරීම

සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ පාඩුව රු. මිලියන 1,067.3 ක් වුවත්, සමාලෝචිත වර්ෂය තුළ රට වෙනුවෙන් සමාගමේ දායකත්වය රු. මිලියන 1,305.6 ක් විය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ තුනක කාලපරිච්ඡේදය තුළ රට වෙනුවෙන් සමාගමේ දායකත්වය පහත පරිදි වේ.

විස්තරය	2015	2014	2013	2012 (අවසාන මාස 03)
	රු.	රු.	රු.	රු.
වර්ෂය සඳහා ලාභය (පාඩුව)	(1,067,300,530)	(150,836,960)	816,828,301	(174,323,817)
එකතුකළා- සේවක පාරිශ්‍රමික	2,092,819,358	1,658,235,775	1,540,551,175	1,414,038,931
රජයට ගෙවූ බදු	(14,860,706)	60,175,975		
ක්ෂය වීම්	294,951,968	268,727,657	199,837,040	46,752,626
අගය එකතු කිරීම	**1,305,610,090**	**1,836,302,447**	**2,557,216,516**	**1,286,467,740**

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.
ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාගමේ මුළු සේවක පාරිශ්‍රමික රු. 434,583,583 කින් වැඩි වී තිබුණි.

3.3 වැදගත් ගිණුම්කරණ අනුපාත

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂය සඳහා සමාගමේ වැදගත් අනුපාත කිහිපයක් පහත දැක්වේ.

විස්තරය	සමාලෝචිත වර්ෂය	පෙර වර්ෂය
ජංගම වත්කම් අනුපාතය	1 : 1.8	1 : 2.25
ක්ෂණික වත්කම් අනුපාතය	1 : 1.7	1 : 1.55

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

සමාගම රු. මිලියන 910.84 ක් හා රු. මිලියන 1,733.87ක් පිළිවෙලින් 2015 වර්ෂය හා 2014 වර්ෂය අවසානයට ස්ථාවර තැන්පත් වල ආයෝජනය කර තිබුණු අතර මෙම ආයෝජන සමාගමේ ජංගම වත්කම් වල ඇතුළත් කර තිබුණි. ඒ හේතුවෙන් සමාගමේ ද්‍රවශීලතා තත්ත්වය සතුටුදායක මට්ටමක පැවතුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 11,872,000 ක වටිනාකමින් යුත් ෂාප්ට් මවුන්ට් ගියර් බොක්ස් (Shaft Mounted Gear Box) දෙකක් උක් ඇඹරීම සඳහා හදිසි අවශ්‍යතා ලෙස සලකා ප්‍රසම්පාදනය කර තිබූ අතර එය 2014 මැයි මස 24 දින ප්‍රධාන ගබඩාවට ලැබී තිබුණි. කෙසේ වුවද මෙය නිෂ්පාදනාගාරයේ සවිකර තිබුණේ 2015 දෙසැම්බර් මාසයේ දීය. තවද 2016 උක් ඇඹරීම ආරම්භ කළ පළමු දිනයේදීම මෙම යන්ත්‍රය ක්‍රියාවිරහිත වී තිබුණි.

(ආ) උක් දඬු බෑමේ පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම

I. පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් රු. 128,910,000 ක වටිනාකමකින් යුතු දොඹකරයක් (Cane Unloading System) මිලට ගෙන තිබුණු අතර එය නිවැරදිව සවිකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස රු. 61,333,644 ක් වැය කර කර්මාන්තායතනයේ පැවති පැරණි දොඹකරය සවිකර තිබුණි.

II. සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් රු. 17,400,000 ක පිරිවැයකට සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදනය කර තිබූ උක් බෑමේ පද්ධති දෙකක් 2015 ජූනි 25 වන විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණි. කෙසේවෙතත්, විධිමත් ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව රු. 1,809,600 ක් වූ අවසන් ගෙවීම 2015 නොවැම්බර් 27 දින සමාගම විසින් සිදු කර තිබුණි.

(ඇ) සමාගමට අයත් සෙවනගල සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදිත එතනෝල් ගැනුම්කරුවන් වෙත නිකුත් කිරීමේදී එම ප්‍රමාණයන් මැන බැලීම සඳහා රු. 1,951,019 ක වටිනාකමකට මද්‍යසාර මැනීමේ යන්ත්‍රයක් (ALCOHOL Flow Meter - Neptune) 2013 වර්ෂයේදී ප්‍රසම්පාදනය කර තිබුණි. කෙසේවෙතත් මෙම යන්ත්‍රය මගින් නිවැරදි මිණුම් දත්ත ලබාදී නොතිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් වාහන සහ පිරියත හා උපකරණ එකසිය විසි එකක් එම කර්මාන්තායතනයට අයත් කෘෂිකාර්මික වැඩපල වෙත අළුත්වැඩියා සඳහා යොමුකර තිබුණි. කෙසේවෙතත් එම වාහන හා යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට ප්‍රමාද වීම මත නිෂ්කාර්යව පැවතුණි. තවද, සමාගම විසින් එම වාහන හා යන්ත්‍ර අළුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඉ) 2012 දෙසැම්බර් මාසයේ සිට 2014 වර්ෂය අවසානය දක්වා අලුත්වැඩියා සඳහා භාරදුන් ට්‍රැක්ටර් 13 ක්, රොබින් පොම්ප 3ක්, ලොරියක් සහ නිසාන් කැබ් රථයක් අළුත්වැඩියා සිදු කිරීමෙන් තොරව තබා තිබුණි.

(ඊ) සෙවනගල සීනි කර්මාන්තය අපජලය පිරිපහදු යන්ත්‍රයක් ඉදිකිරීම සඳහා රු.27,067,812 ක කොන්ත්‍රාත්තුවක් 2014 මැයි මාසයේදී ප්‍රදානය කර තිබුණද 2016 අගෝස්තු 31 වන විටද එය නිමකර නොතිබුණි. එමනිසා කර්මාන්තශාලාව සඳහා ලබාගත යුතු පාරිසරික ආරක්ෂණ බලපත්‍රය ද ලබාගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.

(උ) 2015 වර්ෂය තුළ සිදුවී ඇති රිය අනතුරු 21 ක් පිළිබඳ තොරතුරු විගණනය වෙත ලැබුණු අතර ඉන් අනතුරු 15 කට අදාළ ඇස්තමේන්තුගත පාඩු සඳහා බිල්පත් ඉදිරිපත් කිරීම මඟින් රක්ෂණ සමාගමෙන් රක්ෂණ හිමිකම් ඉල්ලා නොතිබුණි. තවද අලුත්වැඩියා කිරීම සඳහා කෘෂිකාර්මික වැඩ වලට යවා ඇති වාහන අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට ප්‍රමාද වීම හේතුවෙන් අලුත්වැඩියා කිරීමෙන් තොරව ඒවා ධාවනයේ යොදවා තිබුණි.

(ඌ) කළමනාකරුවන්ගේ නිවාස සංකීර්ණයේ නිවාස 04 ක් හා නගර සංවර්ධන අංශයේ අධීක්ෂණය යටතේ පවතින නිවාස 131 ක් අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතියද එය පිළිසකර කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි. මෙයින් නිවාස 12 ක් වසර 10 කටත් වැඩි කාලයක් අළුත්වැඩියා කර නොතිබුණි.

(එ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිලධාරීන් 07 දෙනෙකුගෙන් සහ ලංකා බැංකුව පැල්වත්ත ශාඛාවෙන් කුලී අයකර ගැනීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඒ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් ට්‍රේලර්, බවුසර්, ක්‍රේන්, ලෝඩර්, එක්ස්කැවේටර් 132 ක් සමාගම විසින් ලියාපදිංචි කර නොතිබුණි.

(ඔ) සෙවනගල සීනි කර්මාන්තායතනයට උක් වගා කිරීම සඳහා වෙන්කර දී ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 4198.41 කි. කෙසේවෙතත්, එයින් ඉඩම් හෙක්ටයාර් 281.51 ක වෙනත් බෝග වගා කර ඇති අතර තවත් හෙක්ටයාර් 27.55 ක් අනවසර ඉදිකිරීම් සඳහා යොදාගෙන තිබුණි.

(ඕ) 99 අවුරුදු බදු පදනම යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සමාගම වෙත හෙක්ටයාර් 469.87 ක ඉඩම් ප්‍රමාණයක් පවරා දී තිබුණද සමාගම සතුව බදු ගිවිසුම් නොතිබුණි. ඒ හේතුවෙන් මෙම ඉඩම්වල අනවසර පදිංචිකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාගමට නොහැකි වී තිබුණි.

(ක) සෙවනගල සීනි කර්මාන්තායතනය සතුව නිල නිවාස 57 ක අනවසර පදිංචිකරුවන් පදිංචි වී සිටින අතර තවත් නිවාස 26 ක් අළුත්වැඩියා නොකිරීම හේතුවෙන් පදිංචියට සුදුසු තත්ත්වයේ නොපවතී. මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

(ග) සමාගමේ ඉන්ධන බවුසරයක් අනතුරක් හේතුවෙන් අලාභහානි වී තිබුණි. කෙසේවෙතත්, ආදායම් බලපත්‍ර සහ රක්ෂණ ආවරණ ලබාගෙන නොතිබීම නිසා රු. 906,972 ක අලාභය සමාගමට දැරීමට සිදුවී තිබුණි.

(ඝ) සෙවනගල සීනි කර්මාන්තායතනය විසින් අවස්ථා 04 කදී රු. 2,218,134 ක මුදලක් වැටුප් ගෙවීම් සඳහා හිඟුරාන සීනි කර්මාන්තායතනය වෙත ලබාදී තිබුණද, හිඟුරාන සීනි කර්මාන්තායතනයේ ගිණුම් වල වැටුප් ගෙවීම් ලෙස දක්වා තිබුණේ රු. 1,115,789 ක් පමණක් විය.

(ච) 2014 වර්ෂයේදී කන්තලේ සීනි කර්මාන්තායතනය යළි පිහිටුවීම සඳහා රු. 7,446,704 ක මුදලක් ව්‍යාපෘතියකට වැය කර තිබුණු අතර එයට උක් වගාව සඳහා රු.1,331,000 ක් ද කන්තලේ නව කාර්යාලයක් පිහිටුවීම සඳහා ඉඩම සංවර්ධනය කිරීමට රු. 1,463,153 ක මුදලක්ද ඇතුළත්වී තිබුණි. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය මඟින් කිසිදු ප්‍රතිලාභයක් ලබා ගැනීමකින් තොරව අවසන් කර ඇති අතර උක් වගාව සම්බන්ධයෙන් ද කිසිදු පසු විපරම් කාර්යයක් සිදු කර නොතිබුණි.

(ඩ) සමාගම අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර තිබුණද, සමාගම වෙනුවෙන් විශේෂ විගණනයක් කර ගැනීමට බාහිර පුද්ගලයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් වෙත රු.150,000 ක් වැය කර තිබුණි.

(ත) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ වාහන හා යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා කෘෂිකාර්මික වැඩපොළක් පවත්වාගෙන ගොස් තිබුණද 2014 නොවැම්බර් සිට 2016 මාර්තු මාසය දක්වා කාලය තුළ වාහන හා යන්ත්‍රෝපකරණ 11 ක් අළුත්වැඩියාව සඳහා බාහිර ආයතන වෙත යවා තිබුණි.

(ත) බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 9 කට අයත් ඉඩම් හෙක්ටයාර් 791 ක් උක් වගාකිරීම සඳහා තෝරාගෙන තිබූ අතර ඉන් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 6ක ඉඩම් හෙක්ටයාර් 60.6 ක් පමණක් උක් වවා තිබුණි. මින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක උක් වැවීම අසාර්ථක වී තිබූ අතර වගාකර තිබූ උක් සඳහා කුමක් සිදුවීද යන්න අනාවරණය කර නොගෙන ව්‍යාපෘතිය 2015 අගෝස්තු 28 වන දින අත්හැර දමා තිබුණි. එමනිසා මේ සඳහා දැරූ පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

4.2 මෙහෙයුම් දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සීනි වලට වඩා එතනෝල් මඟින් සමාගමට ලැබෙන දායකත්වය ඉහල අගයක් ගනී. එසේ වුවද, 2013,2014 හා 2015 වර්ෂයන්හිදී සමාගමේ කර්මාන්තශාලාවන්හි මුළු ධාරිතාවයෙන් භාවිතයට නොගත් ධාරිතාවය පිළිවෙලින් 1%කින් 20% කින් හා 45% කින් වැඩි වී තිබුණි. එමනිසා එතනොල් නිෂ්පාදනය හා අලෙවිය පහත වැටීම හේතුවෙන් සමාගමේ ලාභදායීත්වය පහත වැටී තිබුණි.

(ආ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදනය වූ භාවිතයට ගත නොහැකි එතනෝල් ලීටර 35,000 ක පමණ ප්‍රමාණයක් හොඳ තත්ත්වයේ පැවති එතනෝල් ගබඩා කර තිබූ ටැංකියකට (VAT2) මිශ්‍ර කිරීම හේතුවෙන් එතනෝල් ලීටර 60,618 ක් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත් වීමෙන් රු. 18,185,400 ක පාඩුවක් සිදුවී තිබුණි. එම එතනෝල් ප්‍රමාණය 2015 අගෝස්තු 28 දිනට ලීටර 60,731 ක් වූ අතර එය 2015 ඔක්තෝබර් 22 වන විට ලීටර 60,618 දක්වා ලීටර 113 කින් අඩුවී තිබුණි.

(ඇ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ස්කාගාරයට කර්මාන්තශාලාවෙන් පොම්ප කරන ලද මොලෑසස් ප්‍රමාණය හා ස්කාගාරයට සත්‍ය වශයෙන් ලැබෙන මොලෑසස් ප්‍රමාණය අතර වෙනසක් නිරීක්ෂණය විය. ඒ අනුව, මොලෑසස් මෙට්‍රික් ටොන් 751 කට අදාළව 2015 අප්‍රේල් මාසයේදී රු. 22,999,375 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඈ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ දෛනිකව නිපදවන එතනෝල් ප්‍රමාණය ඒවා ගබඩාකර ගන්නා වැට් (VAT) ටැංකි වෙත යැවීමේ දී මිණුම්කරණය කිරීම සඳහා පිළිගත් ක්‍රමවේදයක් භාවිතා කිරීමට සමාගම කටයුතු කර නොතිබුණි.

(ඉ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සීනි නිෂ්පාදන ක්‍රියාවලිය තුළදී සිදුවන සීනි කැට ගැසීම් හා වෙනත් හේතු නිසා භාවිතයට ගත නොහැකි වන සීනි ප්‍රමාණයන් කර්මාන්තශාලාව තුළ එකතු කර එය නැවත නිෂ්පාදන ක්‍රියාවලියට යොදවන නමුත් එම යෙදවුම් ප්‍රමාණයන් ලිඛිතව සටහන් කර ගැනීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(i) සෙවනගල සීනි කර්මාන්තායතනයේ ඇති නිෂ්පාදිත එතනෝල් ලීටර 143,892 ක් ධාරිතාවයක් වන වැට් (VAT) 3 ටැංකිය බාල එතනෝල් ලීටර 35,642 ක් ගබඩා කිරීම සඳහා යොදා ගැනීම හේතුවෙන් ප්‍රමිත එතනෝල් නිෂ්පාදනය ගබඩා කිරීම සඳහා යොදා ගැනීම වෙනුවෙන් භාවිතා කළ නොහැකිව නිෂ්කාර්යව තිබුණි.

(ii) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ එතනෝල්වල වර්ෂය අවසාන භෞතික තොග සත්‍යාපනයේදී ලීටර් 5715.28 ක එතනෝල් අතිරික්තයක් අනාවරණය වී තිබුණි. එතනෝල් තොග සම්බන්ධයෙන් ඒවායේ තත්ත්වය, සත්‍ය පරිමාව, එම අවස්ථාවේදී පැවති ඌනතාවය සහ සම්මත විචලනය යන කරුණු පදනම් කරගෙන නොතිබුණි. එබැවින් පවතින පද්ධති හා පාලන තත්ත්වයන් පිළිබඳව විගණනයේදී සෘජුමකට පත්වීමට නොහැකි විය.

(ඒ) විකුණුම්, අලෙවි, පරිපාලන හා කර්මාන්තශාලාවන්හි මෙහෙයුම් කටයුතු කර ගෙන යා යුතු ආකාරයන් සහ ඒවාට අදාළ පාලනයන්, ප්‍රතිපත්ති සහ ක්‍රියාදාමයන් ඇතුළත් කර පිළියෙල කරන ලැබූ අත්පොත් (Manuals) සමාගම සතුව නොතිබුණි.

(උ) වසර 30 ක පැරණි තත්ත්වයක පවතින දෝෂ සහිත උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර මාරු කිරීමට හෝ අළුත්වැඩියා කිරීමට ආයතනයේ කළමනාකරණය විසින් කටයුතු කර නොතිබූ අතර 2015 වර්ෂයේ යන්ත්‍රෝපකරණ බිඳ වැටීම් මත කර්මාන්තශාලාව නවතා දමා තිබූ පැය ගණන 2014 වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේ වැඩිවී ඇති අතර එය මුළු කර්මාන්තශාලා පැය ගණනෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 12 ක් විය.

(ඌ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ නිෂ්පාදන ඒකක පිරිවැය ගණනය කිරීම සඳහා පිළිගත් පිරිවැය ගිණුම්කරණ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ ප්‍රධාන කාර්යාලයේ රාජකාරී සඳහා අනුයුක්ත කර ඇති පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් සේවකයන් 6 දෙනෙකු සඳහා කළමනාකරණ ගාස්තුවක් ලෙස මාසිකව රු. 1,600,000 ක මුදලක් ගෙවා තිබියදීත්, එම සේවකයන්ට 2015 වර්ෂයේ පැල්වත්ත සීනි කර්මාන්තායතනය විසින් ගෙවා ඇති වැටුප් රු. 2,131,227 ක් විය.

(ආ) මිල තීරණ කමිටුව විසින් පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතනයන්හි නිෂ්පාදිත එතනෝල් අවම හා උපරිම විකුණුම් මිල පිළිවෙලින් රු. 290 ක් හා රු. 350 ක් ලෙස තීරණය කර තිබුණි. සමාගම තම එතනෝල් අවම මිලට වඩා අඩුවෙන් හෝ අඩු මිලට විකුණා තිබුණි. එමනිසා 2015 වර්ෂයේ සමාගමේ එතනෝල් විකුණුම් ආදායම් 2014 වර්ෂයට සාපේක්ෂව රු. 760,169,391 කින් හෝ සියයට 32 කින් අඩුවී තිබුණි.

තවද, ලීටරයක අවම විකුණුම් මිල වන රු. 290 කට එතනෝල් සියයට 90 ක් අලෙවි කර තිබුණු අතර මහා පරිමාණ මත්පැන් නිෂ්පාදකයින්ට වැඩි ලාභයක් උපයාගත හැකිවන පරිදි සමාගමේ අලෙවි ප්‍රතිපත්තිය සකස් වී නිබීමෙන් සමාගමට විශාල අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) 2014 අගෝස්තු 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, පැල්වත්ත හා සෙවනගල සීනි කර්මාන්තායතන, සමාගම යටතට පවරාගෙන තිබුණද, කන්තලේ සහ හිඟුරාන සීනි කර්මාන්තායතන එසේ පවරාගෙන නොතිබුණු හෙයින් එම කර්මාන්තායතන නිෂ්කාර්ය තත්ත්වයේ පැවතුණි.

4.4 ආර්ථික නොවූ ගනුදෙනු

(අ) පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ ගිණුම් පිළියෙල කිරීම සඳහා වාර්ෂිකව රු. 1,371,265 ක ගාස්තුවක් ගෙවමින් ගිණුම්කරණ පැකේජයක් හදුන්වා දී තිබුණි. කෙසේවෙතත්, මෘදුකාංගයේ මොඩියුල බොහෝමයක් සමාගම විසින් භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබූ රු. 576,782,652 ක බැංකු අයිරාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු. 60,590,053 ක පොලියක් ගෙවා තිබුණි.

(ඇ) සමාගමේ අරමුණු වලට සෘජුවම සම්බන්ධ නොවන කාර්යයන් වන, කර්මාන්ත වැවිලි අමාත්‍යාංශය මඟින් බදුල්ල දිස්ත්‍රික්කයේ වතු කම්කරුවන් සඳහා ඉඩම් ඔප්පු බෙදා දීමේ උත්සවයකට අනුග්‍රාහකත්වය වශයෙන් රු. 1,000,000 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) සුළු පරිමාණ උක් ගොවි සීනි නිෂ්පාදන ව්‍යාපෘතිය - බදුල්ල සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.6,628,619 ක මුදලක් වැයකර තිබුණි. එසේ වුවද දරන ලද වියදම්වල නිවැරදිභාවය පිළිබඳව නිසි නිලධාරියෙකුගේ අධීක්ෂණයක් නොතිබුණි. තවද දේශපාලනඥයකුගේ විස්තර ඇතුළත් කර තිබූ හෙයින් රු. 782,843 කට ප්‍රසම්පාදනය කරන ලද ලිපි ද්‍රව්‍ය අදාළ කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගත නොහැකි වී තිබුණි.

(ඉ) උක් පර්යේෂණ ආයතනය විසින් කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගෙන පසුව ස්ථීර පත්වීම ලබාදී තිබූ නිලධාරියකු එම කාලය තුළම බදුල්ල දිස්ත්‍රික්කයේ උක් වගාව සංවර්ධනය කිරීම හා ව්‍යාප්ත කිරීම සඳහා සම්බන්ධීකරණ නිලධාරියෙකු ලෙස පත්කර මසකට රු. 100,000 බැගින් 2014 වර්ෂයේ මාස 11 ක් වෙනුවෙන් රු. 1,100,000 ක් ගෙවා තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රධාන කාර්යාලයේ තථ්‍ය සේවක සංඛ්‍යාව 17 ක් වන අතර පැල්වත්ත සීනි කර්මාන්තායතනයට අයත් සේවකයන් 8 දෙනෙකුද මෙම කාර්ය මණ්ඩලයට ඇතුළත්කර තිබුණි. ප්‍රධාන කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තවද, කළමනාකරණ මට්ටමේ නිලධාරීන් වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන එම පත්වීම් වාර්ෂිකව දීර්ඝ කර තිබුණි.

(ආ) සෙවනගල සීනි කර්මාන්තායතනයේ අනුමත කාර්ය මණ්ඩලය නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. තවද, පැරණි නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු ද කර්මාන්තායතනය තුළ නොවීය.

(ඇ) පැල්වත්ත සීනි කර්මාන්තායතනය සඳහා සේවකයන් බඳවා ගැනීමේ පරිපාටියක් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

	පාලන ක්ෂේත්‍රය	නිරීක්ෂණයන්
(අ)	පිරිවැය හා මූල්‍ය ගිණුම්කරණය	ක්‍රමවත් පිරිවැය හා මූල්‍ය ගිණුම්කරණ ක්‍රමවේදයක් නොතිබීම.
(ආ)	තොග පාලනය	යල් පැනගිය තොග හඳුනාගෙන ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ තොග කපා හැරීමක් සිදුකර නොතිබුණි.
(ඇ)	ණය ගැනි හා ණය හිමි ශේෂයන්	ණයගැනි / ණයහිමි කාල විශ්ලේෂණයක් සිදුකර බොල්ණය හා අඩමාන ණය ප්‍රතිපාදන වෙන්කර නොතිබූ අතර දිගුකාලීන හිඟ ශේෂ නිරවුල් කිරීමට හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඈ)	උපචිත වියදම්	දිගු කලක් නිස්සේ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(ඉ)	මානව සම්පත් කළමණාකරණය	අනුමත බඳවාගැනීමේ පරිපාටියක් නොතිබුණි.
(ඊ)	මිලදී ගැනීම්	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් අනුගමනය කර නොතිබුණි.

ලාභාලාභ සහ අනෙකුත් විස්තීරණ ආදායම ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2015 රු.	2014 රු.
ආදායම්	4	4,881,637,722	5,539,305,323
විකුණුම් පිරිවැය		(5,065,357,085)	(4,904,055,968)
දල ලාභය		183,719,363	635,249,355
වෙනත් ආදායම් සහ වාසි	5	60,227,606	55,818,240
පරිපාලන වියදම්		(966,088,073)	(1,012,541,959)
මූල්‍ය වියදම්	6	(80,753,493)	(50,047,247)
මූල්‍ය ආදායම්	6	117,893,499	160,508,676
බද්දට පෙර ලාභය/ (අලාභය)	7	**(1,052,439,824)**	**(211,012,935)**
බදු වියදම	8	(14,860,706)	(60,175,975)
වර්ෂය සඳහා ලාභය/ (අලාභය)		**(1,067,300,530)**	**(150,836,960)**
කාලපරිච්ඡේදය සඳහා අනෙකුත් විස්තීර්ණ ආදායම - බදු ශුද්ධ		16,473,290	59,138,063
කාල පරිච්ඡේදය සඳහා මුළු විස්තීර්ණ ආදායම -(පසු බදු ශුද්ධ)		(1,050,827,240)	(91,698,897)
කොටසකට ඉපැයීම් (අලාභය)	9	(10,673,005)	(1,508,370)

පිටු අංක 8 සිට 28 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ කොටසක් සේ සැලකිය යුතුය.

මූල්‍ය තත්ව ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනට

	සටහන්	2015 රු.	2014 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල යන්ත්‍ර හා උපකරණ	10	2,599,758,724	2,792,377,905
විලම්භීත බදු වත්කම්	8	85,517,789	86,066,655
මුළු ජංගම නොවන වත්කම්		2,685,276,513	2,878,444,560
ජංගම වත්කම්			
තොග	11	1,426,404,923	1,483,590,602
ජීව විද්‍යාත්මක වත්කම්	12	624,198,372	428,018,378
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්	13	87,686,733	54,759,867
අත්තිකාරම් හා පෙර ගෙවීම්		52,300,501	131,039,684
ගොවීන්ගෙන් අයවිය යුතු ණය	14	837,886,246	930,162,482
සම්බන්ධිත පාර්ශවවලින් අයවිය යුතු මුදල්	25.2	19,168,293	-
ආයෝජන	15	910,838,300	1,733,873,465
මුදල් සහ මුදලට සමාන මුදල්	21	43,492,326	6,851,025
මුළු ජංගම වත්කම්		4,001,975,694	4,768,295,504
මුළු වත්කම්		6,687,252,208	7,646,740,064
හිමිකම් ප්‍රාග්ධනය හා වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	1,000	1,000
රජයේ ප්‍රදාන	17	4,047,990,194	4,048,080,194
සමුච්චිත ලාභය/ (පාඩුව)		(122,644,911)	924,011,372
මුළු හිමිකම		3,925,346,283	4,972,092,566
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම	19	429,568,312	412,697,156
පොළී දරන ණය හා ණයගැනීම්	18	127,417,201	143,104,631
		556,985,513	555,801,787
ජංගම වගකීම්			
පොළී දරන ණය හා ණය ගැනීම්	18	608,854,123	440,401,880
වෙළඳ හා වෙනත් ගෙවිය යුතු මුදල්	20	1,089,451,423	1,156,140,806
ගෙවිය යුතු ආදායම් බදු		506,614,866	522,303,025
සම්බන්ධිත පාර්ශවවලට ගෙවිය යුතු මුදල්		-	-
		2,204,920,412	2,118,845,711
මුළු හිමිකම හා වගකීම්		6,687,252,208	7,646,740,064

.....
සාමාන්‍යාධිකාරී - මුදල්

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමයි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අත්සන් කළේ:

.....
අධ්‍යක්ෂ

.....
අධ්‍යක්ෂ

පිටු අංක 08 සිට 28 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ කොටසක් ලෙස සැලකිය යුතුය.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	රජයේ ප්‍රදාන	සමුච්චිත ලාභය/ (පාඩුව)	එකතුව
	රු.	රු.	රු.	රු.
2014 ජනවාරි 01 දිනට	1,000	3,554,855,177	1,095,710,269	4,650,566,446
රජයේ ප්‍රදාන ආපසු ගෙවීම	-	(774,983)	-	(774,983)
පිරියත හා යන්ත්‍රෝපකරණ ප්‍රත්‍යාගණනය	-	494,000,000	-	494,000,000
ගෙවූ ලාභාංශ	-	-	(80,000,000)	(80,000,000)
වර්ෂය සඳහා අලාභය	-	-	(150,836,960)	(150,836,960)
අනෙකුත් විස්තීර්ණ ආදායම	-	-	59,138,063	59,138,063
මුළු විස්තීර්ණ ආදායම	-	-	(91,698,897)	(91,698,877)
2014 දෙසැම්බර් 31 දිනට	1,000	4,048,080,194	924,011,372	4,972,092,566
රජයේ ප්‍රදාන ආපසු ගෙවීම	-	(90,000)	-	(90,000)
ප්‍රධාන කාර්යාල ශේෂ පත්‍රයේ ගැලපුම් සටහන			4,170,957	4,170,957
ඉකුත් අයිතිකරු වෙනුවෙන් සමාගම ගෙවූ මුදල්	-	-	-	-
වර්ෂය සඳහා ලාභය/ (අලාභය)	-	-	(1,067,300,530)	(1,067,300,530)
අනෙකුත් විස්තීර්ණ ආදායම	-	-	16,473,290	16,473,290
මුළු විස්තීරණ ආදායම	-	-	(1,050,827,240)	(1,050,827,240)
2015 දෙසැම්බර් 31 දිනට	1,000	4,047,990,194	(122,644,911)	3,925,346,283

පිටු අංක 8 සිට 28 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ කොටසක් ලෙස සැලකිය යුතුය.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය

	සටහන්	2015	2014
		රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් (භාවිතා කළ) වූ මුදල් ප්‍රවාහයන්			
බද්දට පෙර ලාභය/ (අලාභය)		(1,052,439,824)	(211,012,935)
ගැලපුම්:			
ක්ෂය කිරීම්	10	307,601,752	278,540,745
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ඇති වූ ලාභ/ (පාඩු)		-	-
මූල්‍ය ආදායම්	6	(117,893,499)	(160,508,676)
මූල්‍ය පිරිවැය	6	80,753,493	50,047,247
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් සඳහා ප්‍රතිපාදන	19	67,391,139	121,540,071
සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන	11	-	8,194,045
බොල් ණය		-	1,919,319
වගකීම් ආපසු පොත්වලට ගැනීම		-	(504,941)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය/ (පාඩුව)		(714,586,940)	88,214,875
තොග (වැඩිවීම)/ අඩුවීම		57,185,679	161,115,254
වෙළඳ හා වෙනත් ලැබිය යුතු මුදල්වල වැඩිවීම		26,644,024	(9,015,085)
ගොවීන්ගෙන් ලැබිය යුතු ණය වැඩිවීම		92,276,236	(167,878,815)
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් වැඩිවීම/ (අඩුවීම)		(66,689,383)	(25,319,640)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල්		(605,170,384)	47,116,590
ගෙවූ ආදායම් බදු		(30,000,000)	-
ගෙවූ විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	19	(34,046,693)	(46,040,698)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		(669,217,077)	1,075,892
ආයෝජන ක්‍රියාකාරකම්වලින් (භාවිතා වූ) මුදල් ප්‍රවාහය:			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම		(124,470,572)	(236,522,276)
ස්ථාවර තැන්පත්වල ආයෝජන ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම		823,035,165	(164,970,508)
ජීව විද්‍යාත්මක වත්කම්වල ආයෝජන		(196,179,994)	-
දේපල, පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබීම්		9,488,000	3,771,000
ලද මූල්‍ය ආදායම්	6	117,893,499	160,508,676
ආයෝජන ක්‍රියාකාරකම්වලට යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**629,766,099**	**(237,213,109)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින්/ (භාවිතා කළ) වූ මුදල් ප්‍රවාහයන්,			
ලබාගත් ණය		-	-
ණය පියවීම්	18	2,056,073	(10,932,248)
ඉකුත් අයිතිකරු වෙනුවෙන් ගෙවූ මුදල්		-	-
රජයේ ආධාර ආපසු ගෙවීම	17	(90,000)	(774,983)
මූල්‍ය කල්බදු වගකීම්වල මුල් මුදල ආපසු ගෙවීම	18	(26,975,280)	(18,687,116)
ගෙවූ පොලී	6	(80,753,493)	(50,047,247)
ගෙවූ ලාභාංශ		-	(80,000,000)
මූල්‍ය ක්‍රියාකාරකම්වල යෙදවූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(105,962,701)**	**(160,441,594)**
ප්‍රධාන කාර්යාලයේ සංචිතයට ගැලපුම්		4,170,957	-
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		(141,042,721)	(396,578,812)
වර්ෂය ආරම්භයේදී වූ මුදල් හා මුදල් හා සමාන දෑ	21	(392,247,607)	4,331,205
වර්ෂය අවසානයේදී මුදල් හා මුදල් හා සමාන දෑ	21	(533,290,327)	(392,247,607)

පිටු අංක 8 සිට 28 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල ඒකාබද්ධ කොටසක් ලෙස සැලකිය යුතුය.

මූල්‍ය ප්‍රකාශවල සටහන්

1. සංයුක්ත තොරතුරු

1.1 පොදු කරුණු

සී/ස ලංකා සීනි (පුද්) සමාගම ශ්‍රී ලංකාවේ දී සංස්ථාපිත කොට ප්‍රභවස්ථාන කර ඇති ආස්ථිත්‍වයකි. රජයට පවරාගැනීමෙන් පසු සමාගම පුද්ගලික සීමාසහිත සමාගමක් ලෙස ස්ථාපිත කරන ලදී. සී/ස ලංකා සීනි (පුද්) සමාගමේ ලියාපදිංචි ලිපිනය කොළඹ 04, මෙල්බන් ඇවනිය්‍ය, අංක 27 දරණ ස්ථානය වන අතර එහි ප්‍රධාන ව්‍යාපාර පරිශ්‍රයන් ඇඹිලිපිටිය හා බුත්තල ස්ථානගත කර ඇත.

සීමාසහිත පුද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කිරීමෙන් අනතුරුව, පැල්වත්ත සුගර් ඉන්ඩස්ට්‍රීස් සහ සෙවනගල සුගර් ඉන්ඩස්ට්‍රීස් දෙකෙහි වත්කම් හා වගකීම්, 2012 ඔක්තෝබර් 01 දින සී/ස ලංකා සීනි (පුද්) සමාගම වෙත මාරු කරන ලදී.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මූල්‍ය කාලපරිච්ඡේදය තුළදී, සමාගමේ මූලික ක්‍රියාකාරිත්වයන් වූයේ උක් වගාකිරීම සීනි හා එතනෝල් නිෂ්පාදනය කිරීම හා අලෙවි කිරීමයි.

1.3 මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අනුමැතිය දුන් දිනය

සී/ස ලංකා සීනි (පුද්) සමාගමේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම 2016 මැයි 31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණයෙන් අනුමැතිය ලබාදෙන ලදී.

2. සාමාන්‍ය ප්‍රතිපත්ති

2.1 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ව ප්‍රකාශය, ලාභාලාභ ප්‍රකාශය සහ අනෙකුත් විස්තීර්ණ ආදායම, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය, ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන් සහිත මුදල් ප්‍රවාහ ප්‍රකාශය යනාදියෙන් සමාගමේ මූල්‍ය ප්‍රකාශ සමන්විත වේ. සමාගමේ මූල්‍ය ප්‍රකාශ, වෙනත් ආකාරයකින් දක්වා නැතහොත් ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කරන ලදී.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත.

2.1.1 අනුකූලතා ප්‍රකාශය

සී/ස ලංකා සීනි (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කර තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව සිදුකර ඇත.

2.1.2 අඛණ්ඩ පැවැත්ම

සමාගමට සැලකිය යුතු අනාගත කාලපරිච්ඡේදයක් සඳහා අඛණ්ඩ පැවැත්මක් සහිතව පවත්වාගෙන යාමට හැකියාව ඇති බවටත්, එය ඈවර කිරීමකට හෝ වෙළඳාම අත්හිටුවීමේ අපේක්ෂාවක් නැති බවටත් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් කර ඇත.

2.2 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

සමාගම එහි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගන්නා ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ.

2.2.1 කාර්යමය සහ ඉදිරිපත් කිරීමේ මුදල් වර්ගය

සමාගම මූලික වශයෙන් වාණිජමය ගනුදෙනු ශ්‍රී ලංකා රුපියල්වලින් කරන නිසා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කරනු ලැබේ. ඒ අනුව මෙහි සඳහන් සමාගමට අදාළ සිදුවීම් හා අවස්ථාවන්වල ආර්ථික තත්වය වඩාත් හොඳින් නිරූපනය වේ. විදේශීය මුදලින් වූ ගනුදෙනු එකී ගනුදෙනුව සිදුවූ දින පැවැති විදේශ විනිමය අනුපාතය මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලදී. වාර්තා කරන දිනට විදේශීය මුදලින් නම් කළ මූල්‍ය වත්කම් සහ වගකීම් එකී වත්කම් හා වගකීම් ජනිත දිනට වූ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. පරිවර්තනය හේතුවෙන් උද්ගත වන විදේශ විනිමය වෙනස ලාභාලාභ ප්‍රකාශයට එරෙහිව හඳුනාගනු ලැබේ.

සියලුම වෙනස්වීම් ලාභාලාභ ප්‍රකාශයට ගනු ලැබේ. විදේශ මුදලක් ලෙස ඓතිහාසික පිරිවැය අනුව ඇති මූල්‍යමය නොවන වත්කම් හා වගකීම්, එකී ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ පැවැති විනිමය අනුපාතය අනුව පරිවර්තනය කෙරේ. විදේශීය මුදලකින් ඇති සාධාරණ අගයට මිනුම් කර ඇති මූල්‍යමය නොවන විෂයයන්, සාධාරණ අගය නිශ්චය කළ දිනට පැවැති විනිමය අනුපාතය භාවිතා කොට පරිවර්තනය කරනු ලැබේ. මූල්‍යමය නොවන විෂයයන් පරිවර්තනය කිරීම හේතුකොට ගෙන උද්ගත වන වාසි හෝ අවාසි, අදාළ විෂයයයේ සාධාරණ වටිනාකම වෙනස්වීමේදී වූ වාසි හෝ අවාසි හඳුනාගැනීමක් ලෙස සලකනු ලැබේ. (විෂයයන්වල පරිවර්තන වෙනස්කම් මත උද්ගත වූ සාධාරණ වටිනාකම් වාසි හෝ අවාසි, අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගැනීම හෝ ලාභ හෝ අලාභ ද අනෙකුත් විස්තීර්ණ ආදායමෙහි හඳුනාගනු ලැබේ.)

2.2.2 ආදායම හඳුනාගැනීම

ගෙවීම් කරනු ලබන්නේ කවදාද යන්න සැලකිල්ලට නොගෙන සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලාඒම සහ ආදායම විශ්වාසදායක ලෙස මිනිය හැකි ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ගිවිසුම්ගතව විස්තර කර ඇති ගෙවීම් කොන්දේසි සැලකිල්ලට ගෙන බදු හා රේගු බදු හැර, ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ වටිනාකමට ආදායම මනිනු ලැබේ. සමාගම ප්‍රධානියා හෝ නියෝජිතයා ලෙස ක්‍රියාකරන්නේ නම් එහි ආදායම සකස් කර ගැනීම් නිශ්චය කර ගැනීමට නිශ්චිත නිර්නායකයන්ට එරෙහිව තක්සේරු කරයි. සමාගම එහි සියලුම ආදායම්, සකස් කරගැනීම්, ප්‍රධානියා ලෙස (Principal) කටයුතු කරන බවට නිගමනය කර ඇත. ආදායම හඳුනාගැනීමට පෙර පහත විස්තර කරන නිශ්චිත හඳුනාගැනීම් නිර්නායකයන්ද යොදාගනී.

භාණ්ඩ විකිණීම

භාණ්ඩවල අයිතියේ අවදානම් හා වාසි ගැනුම්කරුට පැවරූ විට භාණ්ඩ විකුණුම් ආදායම හඳුනාගනු ලැබේ. එකී ආස්ථිත්‍යය සාමාන්‍යයෙන් අයිතිය) හා බැඳුනු අඛණ්ඩ කළමනාකාරිත්ව සහභාගීත්වය රඳවාගැනීම හෝ විකුණූ භාණ්ඩවලට ඵලදායී පාලනයක් හෝ තබාගනු නොලැබේ.

පොලී ආදායම

සියලුම මූල්‍ය උපකරණ ක්‍රමක්ෂය කළ පිරිවැයට මනිනු ලැබේ. පොලී ධාරක මූල්‍ය වත්කම් විකිණීමට ඇති තොග ලෙස වර්ගීකරණය කෙරේ. පොලී ආදායම හෝ වියදම, සඵල පොලී අනුපාතය භාවිතා කරමින් (EIR) සටහන් කෙරේ. මෙම අනුපාතය ඇත්ත වශයෙන්ම ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හා ලැබීම් මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාලය හෝ කෙටිකාලයක් තුලින් සුදුසු පරිදි මූල්‍ය වත්කම් හෝ වගකීම්වල ශුද්ධ කාරක අගය දක්වා වට්ටම් කෙරේ. පොලී ආදායම, ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ආදායම් යටතේ ඇතුළත් කෙරේ.

වත්කම් අපහරණයෙන් ලාභ හෝ අලාභ

වත්කම් අපහරණ ලාභ හෝ අලාභ තීරණය කරනු ලබන්නේ ශුද්ධ විකුණූ මුදල් අදාළ වත්කමේ සාධාරණ අගය සමඟ සැසඳීමෙනි. එය ලාභාලාභ ප්‍රකාශයේ 'වෙනත් මෙහෙයුම් ආදායම්' යටතේ හඳුනාගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කළ වත්කම් විකුණුවහොත් ප්‍රත්‍යාගණනය අතිරික්ත සංචිතයේ ඇති මුදල් ප්‍රමාණය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ.

2.2.3 බදුකරණය

ප්‍රවර්තන බදු

ආදායම් බදු වියදම, ප්‍රවර්තන ආදායම් බද්දෙන් සමන්විත වන අතර ආදායම් බදු වියදම ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එහෙත් හිමිකමට සෘජුව හඳුනාගන්නා ලද විෂයයන්, හිමිකම යටතේ හඳුනාගනු ලැබේ.

වාර්තාකරණ දිනට නීතිගත කළ බදු අනුපාතයන් භාවිතා කරමින් කාලපරිච්ඡේදයට අදාළ බදු අයකළ හැකි ආදායම මත ගෙවිය යුතු යැයි අපේක්ෂා කරන බද්ද ප්‍රවර්තන බද්ද වන අතර ඉකුත් වර්ෂවලට අදාළ ගෙවිය යුතු බදුවලට කරන ලද ගැලපුම්ද ඊට අයත්ය.

විකුණුම් බදු

පහත සඳහන් දෑ හැර ආදායම්, වියදම් සහ වත්කම් විකුණුම් බදුවලින් පසු ශුද්ධ අගයට හඳුනාගනු ලැබේ.

- වත්කම් හෝ සේවා මිලදී ගැනීමක් මත දැරූ විකුණුම් බදු, බදු බලධාරීන්ගෙන් අයකරගත නොහැකි වුවහොත් එවැනි අවස්ථාවලදී විකුණුම් බදු, වත්කම පවරාගැනීමේ පිරිවැයෙන් කොටසක් ලෙස හෝ යොදාගත හැකි පරිදි වියදම් විෂයක කොටසක් ලෙස හඳුනාගනු ලැබේ.
- ලැබිය යුතු හා ගෙවිය යුතු මුදල් විකුණුම් බදු ඇතුළත් අගය සහිතව දක්වනු ලැබේ.

බදු බලධාරීන්ගෙන් හෝ බලධාරීන්ට අයවන හෝ ගෙවිය යුතු ශුද්ධ විකුණුම් බදු, මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි ලැබිය යුතු හෝ ගෙවිය යුතු මුදල්වල කොටසක් ලෙස ඇතුළත් කෙරේ.

විලම්භිත බදු (Deferred tax)

ශේෂ පත්‍ර වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්භීත බදු ප්‍රතිපාදනය කරනු ලැබේ. මූල්‍ය වාර්තාකරණ කාර්යය සඳහා වත්කම් හා වගකීම්වල සාධාරණ අගය හා බදු කාර්යය සඳහා භාවිතා කළ වටිනාකමෙහි තාවකාලික වෙනස බදු සඳහා වෙන්කරනු ලැබේ.

2.2.4 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා දරන ලද සියලුම වියදම් කාලපරිච්ඡේදය සඳහා ලාභය ගණන් ගැනීමේදී ආදායමට එරෙහිව අයකරනු ලැබේ.

අළුත්වැඩියාවන් හා අළුත්කිරීම්, එකී වියදම දැරූ කාලපරිච්ඡේදයේ ලාභයට හෝ පාඩුවට එරෙහිව අයකරනු ලැබේ.

2.2.4.1 ණයගැනීම් පිරිවැය

පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනීත කරනු ලබන සුදුසුකම් ලත් වත්කමක් වන පවරාගැනීමක්, ඉදිකිරීමක් හෝ නිෂ්පාදනයක් ඒවාට සෘජුවම ආරෝපනය (Attributable) කළ හැකි ප්‍රමාණයට හැර, ණය ගැනීම් පිරිවැය ඒවා දැරූ කාලපරිච්ඡේදයේ වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.2.4.2 මූල්‍ය පිරිවැය

ලාභාලාභ ගිණුමේදී හඳුනාගනු ලබන ණයගැනීම්වල පොලී වියදම මූල්‍ය පිරිවැයෙහි අන්තර්ගත වේ. සුදුසුකම්ලත් වත්කමක් වන පවරාගැනීම්, ඉදිකිරීම් හෝ නිෂ්පාදනයක් සඳහා සෘජුව ආරෝපනය කළ නොහැකි ණයගැනීම් පිරිවැය, සඵල පොලී ක්‍රමය යොදාගෙන ලාභාලාභ ගිණුමේදී හඳුනාගනු ලැබේ.

විදේශ මුදල් වාසි හෝ අවාසි ශුද්ධ පදනම මත වාර්තා කරනු ලැබේ.

2.2.5 දේපල, පිරියත හා උපකරණ

සමාගමට අයත් වත්කම්

දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හා ඇතොත් හානිකරණ පාඩු අඩුකොට පිරිවැයට අගය කරයි. දේපල, පිරියත හා උපකරණවල පිරිවැයට, එම වත්කම් අත්පත් කරගැනීමට සෘජුව ආරෝපිත වියදම් ඇතුළත් වේ. සමාගම විසින්ම ඉදිකරනු ලැබූ ඉදිකිරීම් කොන්ත්‍රාත් පිරිවැයට ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය, එකී වත්කම අපේක්ෂිත භාවිතා කිරීමේ තත්වයට පත්කරන තුරු සෘජුවම ආරෝපනය කළ පිරිවැය යම් වත්කමක් නිබූ තැනින් කඩා ඉවත් කිරීමට හා ඒවා යථා තත්වයට පත්කිරීමට දැරූ පිරිවැය සහ සුදුසුකම් ලත් වත්කම්වල ණයගැනීම් පිරිවැය ඇතුළත් වේ. අදාළ උපකරණයක ක්‍රියාකාරීත්වය සම්බන්ධ මිලදී ගත් මෘදුකාංග පිරිවැය, උපකරණයේ පිරිවැය කොටසක් ලෙස ප්‍රාග්ධනීත කරනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණයක කොටසක් එකිනෙක වෙනස් ඵලදායී ජීවන කාලයක් ඇතොත් ඒවා දේපල, පිරියත හා උපකරණ ලෙස (ප්‍රධාන සංරචකයන්) වෙනම ගිණුම්ගත කරනු ලැබේ.

කල්බදු වත්කම්

වැඩපිළිවෙලක් (Arrangement) නීරණය කර නිබුණත් එහි අඩංගු වුවත් කල්බද්දක්, වැඩපිළිවෙලෙහි අවශ්‍ය කොටසක් ලෙස ආරම්භක දිනයේදීම පත්වේ. වැඩපිළිවෙල ඉටුකරගැනීම නිශ්චිත වත්කම හෝ වත්කම්වල භාවිතය මත රඳා පවතී නම්, හෝ වැඩපිළිවෙලක අයිතිය (right) නිශ්චිතව විස්තර කර නැතත් වැඩපිළිවෙල වත්කම භාවිතා කිරීමේ අයිතිය ඇති බව ප්‍රකාශවේ. කල්බදු වත්කමේ අයිතියට අනුෂාංගිකව විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සමාගමට පැවරෙන මූල්‍ය කල්බදු වලදී, කල්බදු දේපලෙහි, කල්බද්ද ආරම්භවන දිනට සාධාරණ අගය හෝ එය අඩුනම් අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය ප්‍රාග්ධනීත කරනු ලැබේ. කල්බදු ගෙවීම්, මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීමේ අඩුවීම අතර විභජනය කෙරේ. ඊට හේතුව වගකීමෙහි ඉතිරි ශේෂය මත පොලී අනුපාතය ස්ථාවරව පවත්වාගෙන යාම සාක්ෂාත් කරගැනීමයි. ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ගාස්තු මූල්‍ය පිරිවැය යටතේ හඳුනාගනු ලැබේ. කල්බදු වත්කමක් එහි ඵලදායී ජීව කාලය තුල ක්ෂය කරනු ලැබේ. කෙසේ වෙතත්, කල්බදු කාලය අවසානයේදී සමාගමට අයිතිය ලබාගැනීමට සාධාරණ නිශ්චිතතාවක් නැතිනම් වත්කමේ ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය හෝ කල්බදු කොන්දේසි යන දෙකෙන් අඩු කාලය තුළදී ක්ෂය කරනු ලැබේ. මෙහෙයුම් කල්බදු ගෙවීම්, කල්බදු කොන්දේසි අනුව සරල මාර්ග පදනමට ලාභාලාභ ප්‍රකාශයේ මෙහෙයුම් වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

පසු වියදම් (Subsequent expenditure)

දේපල, පිරියත හා උපකරණවල අයිතමයක් නැතුව ප්‍රතිශ්ඨාපන පිරිවැය, එකී අයිතමයේ අන්තර්ගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලාඒවි යැයි විශ්වාස කරන විට සහ එහි පිරිවැය විශ්වාසදායක ලෙස මිනිය හැකි නම් එහි ධාරණ අගය හඳුනාගනු ලැබේ. ප්‍රතිශ්ඨාපනය කළ කොටස් ධාරණ අගය පහත දක්වා ඇති හඳුනාගැනීම ඉවත්කිරීමේ ප්‍රතිපත්තිය අනුව හඳුනාගනු ලැබේ.

දේපල, පිරියත හා උපකරණවල එදිනෙදා සේවා පිරිවැය දැරූ ආකාරයට ලාභාලාභ ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

හඳුනාගැනීම ඉවත්කිරීම (De- recognition)

දේපල, පිරියත හා උපකරණ විෂයක ධාරණ අගය අපහරණයකදී හෝ එය භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවන විට හඳුනාගැනීම ඉවත්කරනු ලැබේ. හඳුනාගැනීම ඉවත්කිරීමේ වාසි හෝ අවාසි ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එහෙත් වාසි (Gains) ආදායම් ලෙස වර්ග නොකෙරේ.

ක්ෂය කිරීම

දේපල, පිරියත හා උපකරණ අයිතමයක ක්ෂය, එහි ඇස්තමේන්තුගත ඵලදායී ජීවිත කාලය ඇතුළත සරල මාර්ග ක්‍රමයට ලාභාලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. එනිසා වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභවල අපේක්ෂිත පාරිභෝජන රටාව ඉතා ආසන්න වශයෙන් පිළිඹිබු වේ.

කල්බදු කාලසීමාව අවසානයේදී අයිතිය සාධාරණව සමාගමට හිමි නොවන බවට නිශ්චිතතාවක් නැත්නම් මූල්‍ය කල්බදු යටතේ තබාගෙන ඇති වත්කම් කල්බදු කාලසීමාව සහ සමාන අයිති

වත්කම්වල ඵලදායී ජීව කාලය යන දෙකින් අඩු කාලසීමාව ඇතුළත ක්ෂය කරනු ලැබේ. සින්නක්කර ඉඩම් ක්ෂය කරනු නොලැබේ.

වත්කමක ක්ෂය කිරීම එය භාවිතයට ගත්දා සිට කරනු ලබන අතර එකී වත්කම විකිණීමට තබා ඇති විට හෝ හඳුනා නොගන්නාසේ වර්ගකළ විට ක්ෂය කිරීම නතර කෙරේ.

වත්කමක ඝුන්බුන් වටිනාකම, ඵලදායී ජීවිත කාලය, ක්ෂය කිරීමේ ක්‍රමය එක් එක් මුදල් වර්ෂය අවසානයේදී සමාලෝචනය කර සුදුසු වුවහොත් අනාගතයේදී බලාපොරොත්තු විය හැකි පරිදි ගලපනු ලැබේ.

2.2.6 තොග (Inventories)

යල්පැනගිය සහ සෙමින් චලනය වන තොග සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසු අවසන් තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු මිලට අගය කරනු ලැබේ. ශුද්ධ උපලබ්ධි වටිනාකම ගණනය කරනු ලබන්නේ, සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී එය විකිණිය හැකි මිලෙන්, එය සම්පූර්ණ කිරීම සඳහා දරනු ලබන ඇස්තමේන්තු පිරිවැය සහ විකිණීම සඳහා දරනු ලැබිය හැකි ඇස්තමේන්තුගත පිරිවැය අඩුකිරීමෙනි.

තොග එහි වර්තමාන තත්වයට හා ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය, පහත සඳහන් සමීකරණ භාවිතා කරමින් ගිණුම්ගත කරනු ලැබේ.

- **නිෂ්පාදන තොග**

  වාර්තාකරන දිනය දක්වා ඒමත දරන ලද පොදු කාර්ය පිරිවැය ඇතුළුව සෘජු පිරිවැයට

- **උක් දඬු**

  වාර්තාකරන දිනය දක්වා දරන ලද පැල තවාන් පිරිවැය සහ ඒ මත දරන ලද පොදු කාර්ය පිරිවැයෙන් කොටසක් ඇතුළත් සෘජු පිරිවැයට

අනෙකුත් තොග - තථ්‍ය පිරිවැයට

මාර්ගස්ථ තොග -තථ්‍ය පිරිවැයට

2.2.7 මූල්‍ය මෙවලම්

ආරම්භක හඳුනාගැනීම සහ ඉන් අනතුරුව කෙරෙන අගය කිරීම

මූල්‍යමය වත්කම්

පහත සඳහන් මූල්‍යමය වත්කම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි විෂය පථය යටතේ සාධාරණ අගයට මූල්‍ය වත්කම් ලෙස ලාභාලාභ ගිණුම හරහා වර්ගීකරණය කෙරේ. ණය සහ ලැබිය යුතු මුදල්, තබාගත් පරිනත ආයෝජන, විකිණීමට ඇති මූල්‍ය වත්කම් හෝ ඵලදායී ඉදිරි සුරැකුමක ව්‍යුත්පත්තියන් (derivatives) ලෙස හඳුන්වා දී ඇති ඉදිරි සුරැකුම් උපකරණ (Hedging instrument) උචිත ලෙස, මූලික හඳුනාගැනීමේදී සමාගම එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරනු ලැබේ.

සියලුම මූල්‍ය වත්කම්, ලාභාලාභ හරහා සාධාරණ වටිනාකමට සටහන් කරන ලද මූල්‍ය වත්කම් හැර මූලික වශයෙන් මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට ගනුදෙනු පිරිවැය එකතු කළ වටිනාකමට හඳුනාගනු ලැබේ. අලෙවි ස්ථානයේ රෙගුලාසි හෝ සම්ප්‍රදායානුකූලව ස්ථාපිත කරන ලද කාලසීමාව තුළ වත්කම් බෙදාහැරීමේ අවශ්‍යතාව ඇති විට මූල්‍ය වත්කම් මිලදී ගැනීම් හෝ විකුණුම්, විකුණුම් දිනයේදී හඳුනාගනු ලැබේ. උදා: සමාගම වත්කම මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳුනු දිනය

සමාගමේ මූල්‍ය වත්කම්වලට මුදල් සහ කෙටිකාලීන තැන්පතු වෙළඳ සහ වෙනත් ලැබිය යුතු මුදල්, ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

පසු මිණුම (Subsequent Measurement)

මූල්‍ය වත්කම්වල පසු මිනුම පහත විස්තර කර ඇති වර්ගීකරණය මත සිදු කෙරේ.

ණය සහ ලැබිය යුතු මුදල්

ණය සහ ලැබිය යුතු මුදල් කිසිදු වෙළඳපොලක ලැයිස්තුගත නොකරන, ස්ථාවර හෝ තීරණය කරනු ලබන ගෙවීම් සහිත ව්‍යුත්පත්ති නොවන මූල්‍ය වත්කම්ය. මූලික මිනුමින් පසු එවැනි මූල්‍ය වත්කම් EIR ක්‍රමය භාවිතා කරමින් (සඵල පොලී අනුපාතය) හානිකරණය අඩුකොට ක්‍රමක්ෂය පිරිවැයට පසුව මිනුම් කරනු ලැබේ. ක්‍රම ක්ෂය ගණනය කරනු ලබන්නේ, පවරා ගැනීමේදී ගෙවූ වට්ටම් හෝ වාරික සැලකිල්ලට ගනිමින් සහ EIR හි සම්බන්ධිත කොටසක් වන ගාස්තු හා පිරිවැය ගණන් ගැනීමෙනි. ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය ආදායම් ලෙස EIR හි ක්‍රම ක්ෂය ඇතුළත් කෙරේ.

හඳුනා නොගැනීම (De-recognition)

මූල්‍ය වත්කම් (හෝ භාවිතා කළහොත්, මූල්‍ය වත්කමක කොටසක් හෝ සමාන මූල්‍ය වත්කම් සමූහයක කොටසක්) පහත සඳහන් අවස්ථාවලදී හඳුනාගනු නොලැබේ.

- කල් ඉකුත් වූ වත්කම්වලින්, ලැබීමට අයිතිය ඇති මුදල් ප්‍රදානයන්
- සමාගම වත්කමෙන් ලැබෙන මුදල් ප්‍රවාහයන්ගෙන් ලැබෙන මුදල්වල එහි අයිතිය මාරුකිරීම හෝ හරහා යන වැඩපිළිවෙල යටතේ ("Pass-through" arrangement) ලද මුදල් ප්‍රවාහයන් සම්පූර්ණයෙන්ම වැඩි ප්‍රමාදයකින් තොරව තෙවන පාර්ශවයකට ගෙවීමට වගකීමක් ඇතැයි උපකල්පනය කිරීම. එහිදී,

  (අ) සමාගම වත්කමේ විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මාරුකරනු ලැබේ. නැතහොත්,

  (ආ) සමාගම වත්කමේ විද්‍යාමාන වන සියලුම අවදානම් සහ ප්‍රතිලාභ මාරු කරන්නේ හෝ තබා ගැනීම හෝ නොකරයි. එහෙත් වත්කමේ පාලනය පවරා දෙයි.

සමාගම වත්කමක්න් ලැබෙන මුදල් ප්‍රවාහයන් ලැබීමට ඇති අයිතිය පවරා ඇති විට හෝ වැඩිපිළිවෙල හරහා යාමට එකඟ වී ඇතිවිට, අයිතියේ අවදානම හා ප්‍රතිලාභ කොපමණ ප්‍රමාණයකට රඳවා ගන්නවාද යන්න ගැන ඇගයීමක් කරයි. එය මාරුකිරීමක් හෝ වත්කමේ විද්‍යාමාන වන සියලු අවදානම් සහ ප්‍රතිලාභ රඳවා ගැනීමක් නොකරන විට, වත්කමේ පාලනයද මාරු නොකරයි. එහිදී, වත්කමේ අඛණ්ඩ සමාගමේ මැදිහත්වීමේ ප්‍රමාණයට වත්කම හඳුනා ගනී. එවැනි අවස්ථාවක සමාගම වත්කමේ අන්තර්ගත වගකීමද හඳුනා ගනී. මාරුකළ වත්කම හා ආශ්‍රිත වගකීම, සමාගම තබාගන්නා අයිතිය හා වගකීම නිරූපනය වන පදනමක් යටතේ මනිනු ලැබේ.

මාරු කරන ලද වත්කමේ අඛණ්ඩ මැදිහත් වීම ඇපයක(Guarantee)ස්වභාවයක් ගත්විට වත්කමේ මුල් ධාරණ වටිනාකම සහ සමාගම ආපසු ගෙවීම අවශ්‍ය වූ ප්‍රතිශ්ධාවේ උපරිම අගය යන දෙකෙන් අඩු වටිනාකමට මනිනු ලැබේ.

මූල්‍ය වත්කම් හානිකරණය (Impairment of financial Assets)

සමාගම, එක් එක් වාර්තාකරණ දිනයේදී මූල්‍ය වත්කමක් හෝ වත්කම් සමුහයක් හානිකරණය වේද යන්න ගැන යම් අරමුණුගත සාක්ෂි තිබේදැයි බලයි. මූල්‍ය වත්කමක් හෝ වත්කම් සමුහයක් හානිකරණය කළ යුතුයැයි අදහස් කළහොත් වත්කමේ මූලික හඳුනාගැනීමෙන් පසු සිදුවූ සිදුවීමක් හෝ සිදුවීම් හේතුකොට ගෙන හානිකරණ පිළිබඳ අරමුණු සහගත සාක්ෂි ඇතොත් (අලාභ සහගත සිද්ධියක්) සහ එකී හානි සිදුවීම හෝ සිදුවීම්වලින් මූල්‍ය වත්කමක හෝ සමූහයක අනාගත මුදල් ප්‍රවාහයන්ට බලපෑමක් වෙතොත් එය විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කළ හැක. හානිකරණ සාක්ෂිවලට ඇතුළත් වන්නේ ණයගැතියකු හෝ ණයගැතියන් බරපතල ලෙස මූල්‍ය දුෂ්කරතාවලට පත්වීම, පොලී හෝ මූලික ප්‍රාග්ධනය නොගෙවා සිටීම හෝ යුතුකම් පැහැර හැරීම, ඔවුන් බුම්මත් බවට පත්විය හැකි සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් කිරීම සහ නිරීක්ෂණය කළ හැකි දත්ත වලින් අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහවල මිනිය හැකි අඩු වීමක් පිළිබිඹු වීම එනම්, හිඟ මුදල්වල හෝ ගෙවීම් පැහැර හැරීම් හා සම්බන්ධ ආර්ථික තත්වයන්වල වෙනස්වීම් ක්‍රම ක්ෂය පිරිවැයට ඇති මූල්‍ය වත්කම් සඳහා සමාගම මුලින්ම එක් එක් මූල්‍ය වත්කමට වැදගත් වන හෝ මූල්‍ය වත්කම්වලට සාමූහිකව වැදගත් නමුත් එක් එක් වත්කමට වැදගත් නොවන හානිකරණ අරමුණු සාක්ෂි තිබේදැයි තක්සේරු කරයි. සමාගම හානිකරණ අරමුණු සාක්ෂි තනි තනිව තක්සේරු කළ මූල්‍ය වත්කමට නැති බවට තීරණය කළහොත්, වැදගත් වුවත් නැතත් එය සමාන ණය අවදානම් ඇති මූල්‍ය වත්කම් කණ්ඩායමේ වත්කමක් ලෙස ඇතුළත් කර ඒවා සාමූහිකව හානිකරණය සඳහා තක්සේරු කෙරේ. හානිකරණය සඳහා වෙන් වෙන්ව තක්සේරු කරන වත්කම් සහ හඳුනාගත් හානිකරණ පාඩුවක් හෝ අඛණ්ඩව සිදුවන පාඩුවක් සාමූහික හානිකරණ තක්සේරුවක ඇතුළත් කරනු නොලැබේ.

හානිකරණ පාඩුවක් සිදුවූ බවට අරමුණු සාක්ෂි ඇතොත් පාඩුවේ වටිනාකම වත්කමේ ධාරණ වටිනාකම සහ අනාගත ඇස්තමේන්තු කළ මුදල් ප්‍රවාහවල වර්තමාන අගය යන දෙකේ වෙනස ලෙස මනිනු ලැබේ. (මේ දක්වා සිදු නොවුණු අනාගත අපේක්ෂිත ණය පාඩු හැර) ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවායන්හි වර්තමාන අගය මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කෙරේ. ණය මුදලකට විවල්‍ය පොලී අනුපාතයක් ඇතොත්, යම් හානිකරණ පාඩුවක් මිණීම සඳහා භාවිතා කරන වට්ටම් අනුපාතය වන්නේ වර්තමාන සඵල පොලී අනුපාතයයි. (EIR) වත්කමේ ධාරණ අගය දීමනා ගිණුම හරහා (Allowance account) අඩුකරන අතර පාඩු වටිනාකම ලාභාලාභ ප්‍රකාශයෙන් හඳුනාගනු ලැබේ ලැබිය යුතු ගිණුම්, ආශ්‍රිත දීමනා සමඟ අනාගතයේදී ඇත්ත වශයෙන්ම අයවීමක් බලපොරොත්තු විය නොහැකි නිසා කපාහරිනු ලැබේ. සියලුම සමාන දෑ (collateral) උපලබ්ධි වී හෝ සමාගමට මාරුකර ඇත. හානිකරණය හඳුනාගැනීමෙන් පසු යම් සිදුවීමක් හේතුකොටගෙන, පසු වර්ෂයකදී ඇස්තමේන්තුගත හානිකරණ පාඩුව අඩු හෝ වැඩි වුවහොත් මුලින් හඳුනාගත් හානිකරණ පාඩුව, දීමනා ගිණුමින් ගැලපීම මඟින් අඩු හෝ වැඩි කරනු ලැබේ. අනාගත කපාහැරීමක් පසුව අයකරගත හොත් එම මුදල ලාභාලාභ ප්‍රකාශයේ නිරූපනය කරනු ලබයි.

මූල්‍ය වගකීම්

මූලික හඳුනාගැනීම හා මිනුම

ශ්‍රී.ලං.ගි.ප්‍ර.39 හි විෂය පථය තුළ මූල්‍ය වගකීම් ලාභාලාභ ගිණුම හරහා සාධාරණ අගයට මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. ඒවාට ණය සහ ණය ගැනීම් හෝ උචිත පරිදි සඵල ඉදිරි සුරැකුම් (Hedging) ක, ඉදිරි සුරැකුම් උපකරණ ලෙස ව්‍යුත්පන්නයන් (derivative) ලෙස හඳුනාගෙන ඇති වගකීම් ඇතුළත් වේ.

පසු මිණුම (Subsequent Measurement)

මූල්‍ය වගකීම් මිනීම පහත විස්තර කර ඇති පරිදි ඒවායෙහි වර්ගීකරණය පදනම් කරගෙන කරයි.

ණය සහ ණයගැනීම් (Loans and Borrowings)

මූලික හඳුනාගැනීමෙන් පසු පොලී දරන ණය සහ ණය ගැනීම්, EIR ක්‍රමය භාවිතා කොට ක්‍රම ක්ෂය පිරිවැයට පසුව මනිනු ලැබේ. EIR ක්‍රමක්ෂය ක්‍රියාවලිය හරහා වගකීම් හඳුනා නොගත් විට වාසි සහ අවාසි ලාභාලාභ ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.

පවරාගැනීමක් මත යම් වට්ටමක් හෝ වාරිකයක් හෝ EIR හා සම්බන්ධිත කොටසක් ලෙස සලකන ගාස්තු හා පිරිවැය ගණන්ගෙන ක්‍රමක්ෂය ගණනය කරනු ලැබේ. EIR ක්‍රමක්ෂය, ලාභාලාභ ප්‍රකාශයේ මූල්‍ය පිරිවැය යටතේ ඇතුලත් කරයි.

හඳුනා නොගැනීම (De-recognition)

වගකීමක් යටතේ වූ බැඳීම නිදහස් කළහොත් හෝ අවලංගු කළහොත් හෝ කල් ඉකුත් වුවහොත් එම මූල්‍ය වගකීම හඳුනාගනු නොලැබේ. පවත්නා මූල්‍ය වගකීමක් එම ණයදෙන්නා සමඟම සැලකිය යුතු වෙනස් වූ කොන්දේසි මත වෙන එකක් ප්‍රතිශ්ඨාපනය කළහොත් හෝ පවත්නා කොන්දේසි සැලකිය යුතු ලෙස නවීකරණය කළහොත් එවැනි හුවමාරුවක් හෝ නවීකරණයක්, මුල් වගකීම හඳුනා නොගැනීමක් ලෙස සලකා නව වගකීම හඳුනාගනියි. අදාළ ධාරණ වටිනාකමෙහි වෙනස ලාභාලාභ ප්‍රකාශයේදී හඳුනාගනු ලැබේ.

2.2.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ වලට අතැති මුදල් හා ඉල්ලුම් තැන්පතු ඇතුලත් වන අතර ඒවා ඕනෑම වේලාවක දන්නා මුදල් බවට පරිවර්තනය කළ හැකි අතර ඒවා වටිනාකමෙහි වෙනස්වීමක් පිළිබඳ වැදගත් අවදානමකට යටත් නොවේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශ කාර්යය සඳහා මුදල් හා මුදල් සමාන දෑ වලට පහත සඳහන් දෑ ඇතුළත්ය. අතැති මුදල්, බැංකු තැන්පතු, හිඟ බැංකු අයිරාවල ශුද්ධ වටිනාකම.

2.2.9 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

හානිවීම සඳහා යම් ඇඟවීමක් තිබේදැයි තීරණය කිරීම සඳහා එක් එක් වාර්තාකරණ දිනයේදී සමාගමේ වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කරනු ලැබේ. එවැනි ඇඟවීමක් තිබුණහොත්, වත්කමේ අයවිය යුතු මුදල ඇස්තමේන්තු කරනු ලැබේ.

වත්කමක අයකරගත හැකි මුදල් හෝ මුදල් උපයන ඒකකය වන්නේ එය භාවිතයේදී පවතින අගය සහ විකිණීමට දරන පිරිවැය අඩු කළ විට එහි සාධාරණ අගය යන දෙකෙන් වැඩි අගයයි. භාවිතා කරන වටිනාකම තක්සේරු කිරීමේදී බදු පූර්ව වට්ටම් අනුපාතය යොදාගෙන ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් ඒවායෙහි වර්තමාන අගයන්ට වට්ටම් කරනු ලැබේ. එයින් මුදලේ වර්තමාන තක්සේරු කාලීන වටිනාකම සහ එම වත්කමට නිශ්චිත අවදානම නිරූපනය වේ. මුදල් උපයන ඒකකය වන්නේ වෙනත් වත්කම් හෝ සමූහයෙන් බොහෝ දුරට නිදහස් මුදල් ප්‍රවාහයන් උපයන හඳුනාගත හැකි කුඩාම වත්කම් සමූහයයි.

වත්කමක ධාරන වටිනාකම හෝ එහි මුදල් උපයන ඒකකය එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ පාඩුවක් හඳුනාගනී. හානිකරණ පාඩු ලාභාලාභ ප්‍රකාශයෙහි හඳුනාගැනේ. මුදල් උපයන ඒකකයක හානිකරණ පාඩුවක් හඳුනාගත හොත් පළමුව එකී ඒකකයට වෙන්කළ යම් කීර්තිනාමයක (Goodwill) ධාරන වටිනාකම අඩුකිරීමට සහ පසුව එම ඒකකයේ වෙනත් වත්කම්වල ධාරණ අගය අඩුකිරීම සමානුපාතිකව (pro rate basis) පදනම් යටතේ සිදු කෙරේ.

2.2.10 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ව ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම්, ඉල්ලූ විගස හෝ වාර්තාකරණ දිනයේ සිට වර්ෂයක් ඇතුළත ගෙවීමට සිදුවන වගකීම් වන අතර ජංගම නොවන වගකීම්, වාර්තාකරණ දිනෙන් වර්ෂයකට පසුව ගෙවීමට සිදුවන වගකීම් වේ.

සියලුම දන්නා වගකීම්, මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරන විට ගිණුම්ගත කරනු ලැබ ඇත.

2.2.10.1සේවක ප්‍රතිලාභ

නිශ්චිතදායක සැලැස්ම (Defined contribution plan)

නිශ්චිතදායක සැලැස්මක්, පසු- සේවක ප්‍රතිලාභ සැලැස්මක් වන අතර ඒ යටතේ එක් ආස්ථිත්‍යයක් වෙනම ඇති ආස්ථිත්‍යයකට ස්ථිර දායක මුදල් ගෙවන අතර ඉන්පසු තවදුරටත් මුදල් ගෙවීමට කිසිදු නෛතික හෝ ගිණුම්ගත සවිමත් බැඳීමක් නැත. සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට සියලුම සේකයින් ආවරණය වන පරිදි කෙරෙන දායක මුදල් වගකීම එය දැරූ විට ලාභාලාභ ප්‍රකාශයට වියදමක් ලෙස හඳුනාගැනේ. සමාගම සේවකයින්ගේ දළ වැටුපෙන් 12% ක් සහ 3% ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම (Defined Benefit Plans)

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිතදායක සැලැස්මක් හැර පසු-සේවක ප්‍රතිලාභ සැලැස්මකි. (Post-employment benefit plan) නිශ්චිත ප්‍රතිලාභ ගණනය කරනු ලබන්නේ ස්වාධීන ආයුගණකවරුන් විසිනි. (Actuaries) නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙන් වර්තමාන අගය නිශ්චය කරනු ලබන්නේ ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් වර්ගයට නම්කරන ලද (Denominated) පොලී අනුපාතයට ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම් වට්ටම් කිරීමෙනි. ඒ සඳහා අදාළ වගකීමෙහි කොන්දේසි ආසන්න කරමින් කල්පිරීමට කොන්දේසි ඇත.

නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල වර්තමාන වටිනාකම, උපකල්පන රාශියක් භාවිතා කරමින් ආයුගණක පදනමකින් නිශ්චය කරන ලද සාධක රාශියක් මත පදනම් වේ. නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ වගකීම් නිශ්චය කිරීම සඳහා භාවිතා කරන ප්‍රධාන උපකල්පන සටහන 19.1 හි සඳහන් වේ. එකී උපකල්පනවලට කරනු ලබන වෙනස්කිරීම්, නිශ්චිත ප්‍රතිලාභ වගකීම්වල ධාරණ වටිනාකමට බලපායි.

නිශ්චිත ප්‍රතිලාභ වගකීම් සඳහා ආයුගණක වාසි හෝ අවාසි, ඒවා සිදුවූ කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණයෙන්ම වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගැනේ. එවැනි ආයුගණක වාසි හෝ අවාසි ද වහාම රඳවාගත් ඉපැයීම් වලට හඳුනාගන්නා අතර පසු කාලපරිච්ඡේදයන් සඳහා ලාභාලාභ ගිණුමට යළි වර්ගීකරණය කරනු නොලැබේ. විශ්‍රාම පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයින්ගේ පළමු සේවා වර්ෂයේ සිට කරනු ලැබ තිබේ. කෙසේ වෙතත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව, සේවකයකුගේ වගකීම පැන නගින්නේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් පසුවයි.වගකීම අභ්‍යන්තරිකව අරමුදල් කර නැත.

කෙටිකාලීන ප්‍රතිලාභ (Short-term benefits)

කෙටිකාලීන සේවක ප්‍රතිලාභ වගකීම්, වර්ටම් නොකළ පදනමට මනිනු ලබන අතර අදාල සේවා කාලයට කරන ලද ප්‍රතිපාදනය වියදමක් සේ සලකයි.

2.2.10.2 රජයේ ප්‍රදාන (Government grants)

2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හා ඌන උපයෝජිත වත්කම් පුනුරුදය කිරීමේ පනත බලාත්මක වීමත් සමඟ (Revival of underperforming Enterprises and underutilised Assets Act No.43 of 2011) ශේෂපත්‍රයේ පිළිඹිබු වන රජයේ ප්‍රදාන පවරාගත් ශුද්ධ වටිනාකමින් සමන්විත වේ. පසුව එකී ආස්ථිතායයේ මෙහෙයුම් කටයුතු කරගෙන යාම සඳහා කාරක ප්‍රාග්ධනයයෙන් දායක වේ.

2.2.10.3 වෙන්කිරීම්

ඉකුත් සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතොත්, ප්‍රතිපාදනයක් හඳුනාගනී. සමාගමට දැනට නෛතික හා සවිමත් වගකීමක් ඇති අතර එය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිය. සහ ආර්ථික ප්‍රතිලාභවල සම්පත් පිටතට ගලායාමක් අන්තර්ගතව ඇති බවට සම්භාවිතාවක් ඇති නිසා වගකීම නිරවුල් කිරීම අවශ්‍ය විය හැක.

2.2.11 ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කිරීම්

යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂය සමඟ සංගත වේ.

2.3 ඇස්තමේන්තු හා විනිශ්චයන් භාවිතා කිරීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී වාර්තා කරන කාලපරිච්ඡේදය අවසානයට සටහන් කරන ලද ආදායම්, වියදම්, වත්කම්, වගකීම් හා අසම්භාව්‍ය වගකීම් හෙලිදරව් කිරීම්වලට බලපාන විනිශ්චයන්, ගැලපීම්, ඇස්තමේන්තු හා උපකල්පන කිරීමට කළමනාකාරිත්වයට අවශ්‍ය වේ. කෙසේ වෙතත්, එවැනි උපකල්පන හා ඇස්තමේන්තුවලට අවිනිශ්චිතතාවේ ප්‍රතිඵල හේතුවෙන් අනාගත කාලපරිච්ඡේදවලට බලපාන වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට සිදුවිය හැකිය.

විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීමේදී අවස්ථාවෝචිතව සාධාරණයැයි විශ්වාසකරන අපේක්ෂාවන් ඇතුළුව ඓතිහාසික පළපුරුද්ද හා වෙනත් සාධක පදනම් වේ. එබැවින් තථ්‍ය අත්දැකීම් සහ ප්‍රතිඵල එම විනිශ්චයන් හා ඇස්තමේන්තුවලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා සඳහන් කළ උපකල්පන කෙරීගෙන යන පදනමින් සමාලෝචනය කෙරේ. සංශෝධන එම කාලපරිච්ඡේදයට හා යම් අනාගත කාලපරිච්ඡේදයකට පමණක් බලපායි නම් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කරන සංශෝධන, ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාලපරිච්ඡේදයට හඳුනා ගනු ලැබේ.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීම් ක්‍රියාවලියේදී, අනාගතයට අදාළව කරන ලද ප්‍රධාන උපකල්පන සහ වාර්තාකරණ දිනට ඇස්තමේන්තු ප්‍රභවයන් සහ ඊළඟ වර්ෂය ඇතුළත වත්කම් හා වගකීම්වල ධාරණ වටිනාකමට ප්‍රමාණාත්මක ගැලපුම් කිරීමට හේතුවන වැදගත් අවදානමක් ඇති අදාළ ගැලපුම් පහතින් සාකච්ඡා කෙරේ.

මූල්‍ය නොවන වත්කම් හානිකරණය

වත්කමක හෝ මුදල් උපයන ඒකකයක ධාරණ වටිනාකම, එහි අයකරගත හැකි වටිනාකම ඉක්මවන විට සහ එහි සාධාරණ වටිනාකමින් විකිණීමට දැරූ පිරිවැය අඩුකොට සහ එහි භාවිතා වන වටිනාකම යන අගයෙන් වැඩි අගයක් ඇති විට හානිකරණයක් පවතී. විකිණීමට දැරූ පිරිවැය අඩුකළ සාධාරණ වටිනාකම ගණනය කිරීමට පදනම් වන්නේ සමාන වත්කම්වල තමාගේ ප්‍රයෝජනය තකා කරගන්නා (Arm's length transactions) අනුගම්‍ය විකුණුම් ගනුදෙනු (Binding sales

transactions) වඳින් පවත්නා දත්ත හෝ නිරීක්ෂණය කළහැක් වෙළඳපොල වට්නාකමින් වත්කම අපහරණය කිරීමට දැරූ පිරිවැය අඩුකළ වට්නාකම මතයි. භාවිතා කරන වට්නාකම (Value in use) ගණනය කිරීමට පදනම් වන්නේ වට්ටම් කළ මුදල් ප්‍රවාහ ක්‍රමයයි. තක්සේරු කිරීමේ කාර්යය සඳහා භාවිතා කරන වර්ධන අනුපාතය සහ අපේක්ෂිත අනාගත මුදල් ඇතුලට ගලාඒම් මෙන්ම අයවිය යුතු මුදල් වට්ටම් කළ මුදල් ප්‍රවාහ මාදිලිය (Model) සඳහා භාවිතා කළ වට්ටම් අනුපාතයට වඩාත් සංවේදී වේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා ක්ෂය වීම්

දේපල, පිරියත හා උපකරණවල ඵලදායී ජීව කාලය සහ ඝුන්ඛුන් වට්නාකම අපේක්ෂිත වත්කම පාවිච්චි කරන කාලය සහ එකී වත්කම්වල ආර්ථික ජීවකාලය පදනම් කරගෙන කළමනාකාරීත්වය නියම කරයි. තාක්ෂණික දියුණුව හෝ වත්කම් භාවිතය වැනි අවස්ථාවල පසුව කරනු ලබන වෙනස්වීම් හේතුකොට ගෙන තථ්‍ය ඵලදායී ජීව කාලය හෝ ඝුන්ඛුන් වට්නාකම මුල් ඇස්තමේන්තුවෙන් වෙනස් වේ. දේපල, පිරියත හා උපකරණවල ප්‍රධාන විෂයයන්වල ඝුන්ඛුන් අගය සහ ඵලදායී ජීව කාලය කළමනාකාරීත්වය විසින් වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබේ.

ලැබිය යුතු මුදල්වල හානිකරණය

සමාගම සෑම වාර්තාකරණ දිනකම යම්කිසි දීමනාවක් ලාභාලාභ ප්‍රකාශයෙහි ඇතුළත් කළ යුතුද යන්න තක්සේරු කිරීම සඳහා සියලුම ලැබිය යුතු මුදල් සමාලෝචනය කරයි. හිඟ මුදල්වල කාලසීමාව සහ අයකරගැනීම අවිනිශ්චිත බවට කළමනාකාරීත්වය දැනුවත් බව ඇඟවීම වැනි වෙනත් සාධකද සැලකිල්ලට ගනිමින් එවැනි දීමනාවක් ඇස්තමේන්තු කිරීමට කළමනාකාරීත්වය විනිශ්චයක් භාවිතා කරයි.

3. නිකුත් කළ නමුත් තවම බල නොපැවැත්වෙන ප්‍රමිතීන්

ශ්‍රී.ල.මු.වා.ප්‍ර.9 (SLFRS 9) - මූල්‍ය උපකරණ

දැනට පවතින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 - මූල්‍ය උපකරණ: හඳුනාගැනීම හා මිනුම යටතේ ඇති මාර්ගෝපදේශ වෙනුවට ශ්‍රී.ල.මු.වා.ප්‍ර.9 ප්‍රතිශ්ඨාපනය කර ඇත. ශ්‍රී.ල.මු.වා.ප්‍ර.9 හි පහත සඳහන් දෑ සඳහා සංශෝධිත මාර්ගෝපදේශ ඇතුළත් වේ. එනම්, මූල්‍ය උපකරණ වර්ගීකරණය හා මිනීම, මූල්‍ය වත්කම් හානිකරණය ගණනය කිරීම සඳහා නව අපේක්ෂිත ණය පාඩු මොඩලය සහ නව පොදු ඉදිරි සුරැකුම් (HEDGE) ගිණුම්කරණ අවශ්‍යතා. තවද, එය LKAS 39 හි සඳහන් මූල්‍ය උපකරණ හඳුනාගැනීම හා හඳුනානොගැනීම සඳහා වූ මාර්ගෝපදේශ තවදුරටත් ඉදිරියට ගෙනයයි.

